# සටහන

2016 මැයි - ජූනි 5 - 6 කලාපය

# නිදහස හා ගෝලීයකරණය


2 ලීච්ටන්ස්ටයින් රාජ්‍යයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 ගෝලීයකරණය සහ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ගෝලීයකරණ ක්‍රියාවලිය

13 මොකද්ද මේ CAS, CEFTS කියන්නේ

23 විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති

27 ස්ථායීතාව සහ ශක්තිමත්භාවය සඳහා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය



ISSN 1391-3697

9 780041 001068


04100106 Rs.20/-


රු. 20/-


ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# ලීච්ටන්ස්ටයින්

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...






| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 160<br>වර්ග කි.මී. 160<br>වර්ග කි.මී. 0 |
| ජනගහනය (2016 ජූලි ඇස්තමේන්තු) | 37.937 |
| ජනගහන වර්ධන වේගය (2016 ඇස්තමේන්තු) | 0.82% |
| උපත් අනුපාතය (2016 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 10.4 |
| මරණ අනුපාතය (2016 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 7.3 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2016 ඇස්තමේන්තු) | 81.9 |
| ළදරු මරණ අනුපාතය (2016 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 4.3 |
| සේවා වියුක්තිය (2014 ඇස්තමේන්තු) | 3.4% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2011) | 53.7 |
| ශ්‍රම බලකාය (2012 ඇස්තමේන්තු) | 35,830 |
| දළ දේශීය නිෂ්පාදිතය (2009 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 3.2 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2012 ඇස්තමේන්තු) | 1.8% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2009 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 89,400 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>8%<br>37%<br>55% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2015 ඇස්තමේන්තු) | 2.1% |
| උද්ධමන අනුපාතය (2012 ඇස්තමේන්තු) | -0.2% |
| ආනයන (2012 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 2.09 |
| ආනයන භාණ්ඩ | කෘෂිකාර්මික නිෂ්පාදන, අමුද්‍රව්‍ය, බලශක්ති නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ, යකඩ නිෂ්පාදන, ඇඟලුම්, ආහාර ද්‍රව්‍ය, මෝටර් රථ |
| අපනයන (2012 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 2.09 |
| අපනයන භාණ්ඩ | කුඩා පරිමාණ විශේෂිත යන්ත්‍රෝපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, මෝටර් රථ අමතර කොටස්, දන්ත උපකරණ, දෘඩාංග, සැකසූ ආහාර, අක්ෂි උපකරණ |

### ලීච්ටන්ස්ටයින්

ලීච්ටන්ස්ටයින් රාජ්‍යය 1719 දී ශුද්ධ වූ රෝමානු අධිරාජ්‍යය තුළ ස්ථාපනය වූවකි. නැපෝලියානු යුද සමයේදී ප්‍රංශ හා රුසියානු යුද භටයින් විසින් අත්පත් කරගෙන සිටි මෙම රාජ්‍යය 1806 දී ස්වෛරී රාජ්‍යයක් බවට පත්වී 1815 දී ජර්මානු සමූහාණ්ඩුවට එක්විය. 1866 දී සමූහාණ්ඩුවේ විසිරයෑමත් සමඟ ලීච්ටන්සටයින් සම්පූර්ණ නිදහස හිමිකරගත්තේය. පළමුවන ලෝක යුද්ධය නිමාවට පත්වන තුරු ඔස්ට්‍රියාව සමඟ කිට්ටු සබඳතා පැවැත්වූ ඔවුන් හට යුද සමයේ සිදුවූ ආර්ථික පරිහානියත් සමඟ ස්විට්සර්ලන්තය සමඟ රේගු සහ මූල්‍ය සබඳතාවලට එක්වීමට සිදුවුනි. මෙම රට පිහිටා තිබෙන්නේ මධ්‍යම යුරෝපයේ ඔස්ට්‍රියාවත් ස්විට්සර්ලන්තයත් අතර කොටසකය. ලීච්ටන්සටයින් හි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වන්නේ ව්‍යවස්ථාමය රාජාණ්ඩු ක්‍රමය යටතේයි. ඔවුන්ගේ ජාතික දිනය අගෝස්තු 15 දාට යෙදී තිබෙන අතර අගනගරය "වදූස්" ය. ව්‍යවහාර මුදල ස්විස් ෆ්‍රෑන්ක් වෙයි.■

**මෙම කලාපයේ ලිපි සමාලෝචනය**
එස්.එස්. රත්නායක මයා - සහකාර අධිපති
ජේ.පී. මාම්පිටිය මහත්මිය - සහකාර අධිපති

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# ගෝලීයකරණය සහ
## නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ගෝලීයකරණ ක්‍රියාවලිය

සංජය වීරසිංහ
සහකාර අධ්‍යක්‍ෂ
සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

වර්තමානයේ සෑම සමාජීය විද්‍යා විෂයයක් තුළ ම පාහේ ගෝලීයකරණය යනු ඉතා ජනප්‍රිය මාතෘකාවකි. නවීන ජාත්‍යන්තර ක්‍රියාකාරිත්වයන් ජාතික රාජ්‍යයන්ගේ සීමාවන් ඉක්මවා යමින් සෑම රටක ම අභ්‍යන්තර කටයුතුවලට බලපෑම් කරනු ලබන තත්ත්වයක් වර්තමානයේ දැකගත හැකිය. වර්තමානයේ කිසියම් සමාජයකට හෝ රටකට හුදෙකලාව පැවතීම ඉතා අපහසු කාර්යයක් වන අතර ගෝලීය සම්බන්ධතා ජාලය තුළ නිරන්තරයෙන් ම අන්තර් ක්‍රියාවල යෙදීමට සිදු වේ. මෙම ලිපිය තුළින් ප්‍රධාන වශයෙන් ම ගෝලීයකරණ ක්‍රියාවලිය පිළිබඳ ව පූර්ව විග්‍රහයක යෙදෙන අතර එහි ස්වරූපයන්ගෙන් එකක් වන ආර්ථික ගෝලීයකරණය පශ්චාත් නිදහස් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පිළිබිඹු වන අයුරු විග්‍රහ කිරීමට උත්සාහ දරනු ලබයි.

### ගෝලීයකරණය

ගෝලීයකරණය යනු සමාජ, ආර්ථික, සංස්කෘතික හා ශ්‍රම බලකායේ සංක්‍රමණයෙන් එකිනෙකා අතර පවතින විපර්යාසය තුනී වී වෙනස්කම් අතර පරතරය අඩු වන සහ බැඳීම්වල පරාසයන් ප්‍රසාරණය වන ක්‍රියාදාමයකි. වර්තමාන කුටුම්භයක් සලකා බලන විට එහි සාමාජිකයන් අතර විවිධ රටවල නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ රැසක් පවතිනු දැකිය හැකි ය. උදාහරණයක් ලෙස ජපානයේ නිෂ්පාදනය කරන ලද මෝටර් රථයක්, චීනයේ නිෂ්පාදිත දුරකථනයක්, ඇමරිකාවේ නිෂ්පාදිත පරිගණකයක් ආදී නිෂ්පාදන රැසක් එක ම ගෘහයක් තුළ දැක ගත හැකි ය. වර්තමාන කුටුම්භ සංස්ථාව මෙසේ සංකීර්ණ පරිභෝජන රටාවකට උරුමකම් කීමට මූල බීජය සපයනු ලබන්නේ ගෝලීයකරණයයි. එම නිසාවෙන් ගෝලීයකරණය යනු අත් හළ නො හැකි සමස්ත ලෝකයට ම බලපෑම් කරනු ලබන විවිධ දැනුම් ක්ෂේත්‍රයන්ගෙන් විග්‍රහ කිරීමට උත්සාහ කරන ක්‍රියාවලියකි. ඓතිහාසික මූලාශ්‍රයන්ට අනුව පුරාණ මැසිඩෝනියානු පාලකයෙකු වූ මහා ඇලෙක්සැන්ඩර් රජු ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් ආක්‍රමණය කර ඇත. මෙවැනි ආක්‍රමණයන්, විවිධ සම්පත් සොයා විවිධ ජාතීන් විවිධ රටවල්වලට සංක්‍රමණය වීම වැනි කරුණු ගෝලීය සම්බන්ධතා ජාලය වර්ධනය වීමට හේතු විය. එහි උච්චතම ප්‍රතිඵලය වන්නේ යටත් විජිතකරණ ක්‍රියාවලිය ආරම්භ වීමයි. මෙම තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස යටත් විජිත රටවල් අධිරාජ්‍යවාදී රටවල්වලට අමුද්‍රව්‍ය සපයන මධ්‍යස්ථාන බවට පත් වූ අතර අධිරාජ්‍යවාදී රටවල් විසින් නිෂ්පාදන වෙළෙඳපොළ ලෙස යටත් විජිතයන් භාවිත කෙරිණි. තරමක් දුරට මෙම තත්ත්වයට බාධාවක් ලෙස පැවතියේ ලෝක සමාජවාදී කඳවුර සහ ධනවාදී කඳවුර අතර පැවති සීතල යුද්ධයයි. 1990 දී සෝවියට් සමූහාණ්ඩුව බිඳ වැටීමත් සමඟ ම ලෝකය වර්තමාන ගෝලීයකරණ අවධියට බාධාවකින් තොර ව ප්‍රවිශ්ට විය. ගෝලීයකරණ ක්‍රියාවලියේ ඓතිහාසික විකාශනය ඉහත ආකාරයෙන් සාරාංශ කළ හැකි අතර ඊට අදාළ චින්තන රාමුව ද විග්‍රහ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ගෝලීයකරණය (Globalization) යන පදය Webster ජාත්‍යන්තර ශබ්දකෝෂය තුළට 1961 වර්ෂයේ දී ඇතුළත් කළ අතර එය 1986 දී ඔක්ස්ෆර්ඩ් (Oxford) ශබ්දකෝෂය තුළට ඇතුළත් කරන ලදී. බොහෝ පුද්ගලයන් ජාත්‍යන්තරීකරණය සහ ගෝලීයකරණය ඒකාර්ථයෙහිලා සලකන බවක් දක්නට ලැබේ. එහෙත් පීටර් ඩිකන් (Dicken - 1992) ට අනුව ගෝලීයකරණය යනු ජාත්‍යන්තරීකරණයෙන් ගුණාත්මක ව වෙනස් වන්නක් වන අතර එය ජාත්‍යන්තරීකරණයේ ගැඹුරු හා සංකීර්ණ ලක්ෂණ පිළිබිඹු කරන ක්‍රියාවලියකි. මෙම අදහසට අනුව පැහැදිලි වන්නේ ගෝලීයකරණය යනු ජාතික රාජ්‍යයන්ගේ සීමාව ඉක්මවා යමින් රාජ්‍යයන් අතර අන්තර් සබැඳියාව හා අන්තර් පරායත්තතාව

වැඩිදියුණු කරන ක්‍රියාවලිය පදනම් කොට නිර්මාණය වූ තත්ත්වයක් බව ය. ලෝකය සමජාතීය ජාත්‍යන්තර වෙළෙඳපොළක් කරා ගමන් කරන අතර ඕනෑ ම රටක සාමාජිකයන් එම ජාත්‍යන්තර වෙළෙඳපොළේ නිෂ්පාදකයන් හෝ පරිභෝගිකයන් බවට පත්වීම වර්තමානය වන විට ශීඝ්‍රයෙන් වර්ධනය වන තත්ත්වයකි. ඩිකන්ස්ගේ අදහස් තුළ ගෝලීයකරණයේ ආර්ථික අංශය පමණක් විවරණය කෙරෙන අතර ඇන්තනී ගිඩන්ස්ට (Giddens - 1990) අනුව එය සමාජ සම්බන්ධතා අංශයෙන් ද වැදගත් වන ක්‍රියාවලියකි. ගිඩන්ස්ට අනුව ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස සමාජ හා සංස්කෘතික සම්බන්ධතා පුළුල් ව සහ නව මුහුණුවරකින් පවතින අයුරු දැකගත හැකි ය. සන්නිවේදන මාධ්‍යයේ සහ ප්‍රවාහනයේ දියුණුවෙහි ප්‍රතිඵලයක් ලෙස ජාතික සංස්කෘතියට ගෝලීය සංස්කෘතිය මිශ්‍රවීමක් සිදු වී ඇත. ආහාර පාන, විලාසිතා, ගෘහනිර්මාණ ශිල්පය ඇතුළු බොහෝ සංස්කෘතික අංගයන් ගෝලීයකරණයට ලක්වීම මෙහි දී හඳුනාගත හැකි ය. උදාහරණ ලෙස ලොව පුරා පවත්වාගෙන යනු ලබන අවන්හල් එකම ප්‍රමිතියකින් යුක්ත ව ආහාර පාන සැපයීමට උත්සාහ දැරීම පෙන්වා දිය හැකි ය. මෙවැනි සිදුවීම්වලින් පැහැදිලි වන්නේ ඇන්තනී ගිඩන්ස් පවසන අයුරින් ගෝලීයකරණයේ ආර්ථික මෙන් ම සමාජීය බලපෑමක් ද පවතින බව ය. ගෝලීයකරණ ක්‍රියාවලිය පිළිබඳ වඩාත් සාර්ව මට්ටමේ නිර්වචනයක් ඩේවිට් හාවි (Harvey-1989) විසින් ඉදිරිපත් කර ඇත. ඔහුට අනුව කාලය හා අවකාශය අතර පරතරය අවම වීම ගෝලීයකරණයයි. 1920 සිට 1990 අතර කාලය තුළ සාගර හා වරාය ප්‍රවාහන ගාස්තු තුන් ගුණයකින් පහළ ගොස් ඇත. මේ හැරුණු විට 1930 සිට 1990 වන විට මගී සැතපුමක් සඳහා වන ගුවන් සේවා ප්‍රවාහන ගාස්තු සැලකිය යුතු ලෙස පහළ වැටී ඇත. මෙසේ ප්‍රවාහන පිරිවැය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස අන්තර් රාජ්‍ය කාලය හා අවකාශය අතර පරතරය අවම වී ඇත. අනෙක් අතට සමාජ වෙබ් අඩවි, දුරකථන සබඳතා වැනි සන්නිවේදන උපක්‍රම සඳහා පවතින පිරිවැය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. මෙවැනි තත්ත්ව තුළ ලොව විවිධ ජාතීන් අතර ඇති දුරස්ථභාවය මග හැරෙමින් පවතිනු දැකිය හැකිවාක් මෙන් ම ලෝකය විශ්ව ගම්මානයක් කරා ගමන් කරන අයුරු ද පෙනී යයි. මේ අනුව කාලය හා අවකාශය අතර පරතරය අවම වීම ගෝලීයකරණය යනුවෙන් හාවි විසින් කරනු ලැබූ විග්‍රහය ඉතා තාර්කික වූවක් බව හඳුනා ගත හැකි ය. කියොහේන් සහ නේ (Kiohane and Ney) යන දෙදෙනාට අනුව ගෝලීයකරණයේ ස්වරූපයන් කිහිපයක් පවතී. එනම් ආර්ථික හා මූල්‍ය ගෝලීයකරණය, හමුදා හෝ උපායමාර්ගික ගෝලීයකරණය, පාරිසරික ගෝලීයකරණය සහ සමාජ සංස්කෘතික ගෝලීයකරණය වේ. ගෝලීයකරණයේ උක්ත විවිධ ස්වරූපයන් අතරින් ආර්ථික ගෝලීයකරණය පිළිබඳ ව පමණක් මෙම ලිපිය තුළින් ගැඹුරින් සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය.

## ආර්ථික ගෝලීයකරණය

ගෝලීයකරණයේ වඩාත් බලපෑම් සහගත පැතිකඩ ලෙස බොහෝ චින්තකයන් විසින් හඳුනා ගනු ලබන්නේ ආර්ථික ගෝලීයකරණයයි. ජාතික රාජ්‍ය සීමා අභිබවා භාණ්ඩ හා සේවා හුවමාරු වීම, නිෂ්පාදන සාධක ගලායෑම, මූල්‍ය වත්කම් විසිර පැතිර යෑම, තාක්ෂණික දැනුම ගලායෑම යන ක්‍රියාවලි ආර්ථික ගෝලීයකරණය ලෙස හඳුන්වා දිය හැක. වර්තමානය වන විට ඕනෑ ම රටක පාරිභෝගිකයෙකුට වෙනත් රටවල නිෂ්පාදිත භාණ්ඩ පරිභෝජනය කළ හැකි අතර ඕනෑ ම නිෂ්පාදකයෙකුට ඕනෑ ම රටකට භාණ්ඩ අපනයනය කළ හැකි ය. මේ අනුව ආර්ථික ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සබඳතාව ජාත්‍යන්තර මට්ටම දක්වා ප්‍රසාරණය වී ඇත. ලෝකයේ විවිධ රටවල් අතර පවතින සම්පත් බෙදී යෑමේ අසමමිතිකතාව හා රටවල්වල පිහිටීම පදනම් කොට ගෙන රාජ්‍ය ආර්ථිකය ගෝලීයකරණය වීම තීව්‍ර වී ඇත. උදාහරණයක් ලෙස ආසියාවේ රන් දොරටුව ලෙස හැඳින්වෙන සිංගප්පූරුව ගෝලීයකරණය වීමට එහි පිහිටීම සෘජු බලපෑමක් කර ඇත. අනෙක් අතට විවිධ රටවල් අතර පවතින තාක්ෂණික හා සම්පත් විෂමතාව මෙන් ම ශ්‍රම බලකායේ ස්වභාවය පදනම් කර ගෙන නිෂ්පාදන ක්‍රියාවලිය ජාලගත වී ඇති අයුරු දැක ගත හැක. එමෙන් ම එක ම භාණ්ඩයක කොටස් විවිධ රටවල් තුළ නිෂ්පාදනය වීමේ ක්‍රියාවලිය හරහා ද ආර්ථික ගෝලීයකරණය ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.

ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා වර්ධනය වීම, සෘජු විදේශ ආයෝජනවල වර්ධනය වැනි ආර්ථිකයේ වැදගත් අංශ ආර්ථික ගෝලීයකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵල වේ. ආර්ථික ගෝලීයකරණ ක්‍රියාවලිය මෙවැනි අංශ ඔස්සේ විශාල වශයෙන් ව්‍යාප්ත වීමට ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරිත්වය මහගු පිටුබලයක් වේ. ලෝක වෙළෙඳ සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව එ වැනි ප්‍රමුඛ පෙළේ සංවිධාන අතරින් කිහිපයකි. මෙ වැනි සංවිධානවල ක්‍රියාකාරිත්වය හේතු කොට ගෙන බොහෝ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයන් අතර අන්තර් සබඳතා වර්ධනය

වී ඇත. වර්තමානය වන විට සමහර බහුජාතික සමාගම්වල සමස්ත නිෂ්පාදන වටිනාකම තුන්වන ලෝකයේ ඇතැම් රටවල දළ දේශීය නිෂ්පාදිතය ද ඉක්මවා ගොස් ඇති අතර, එ වැනි සමාගම්වල නිෂ්පාදන සාධක ද ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇත. එ නම් භූමිය, ශ්‍රමය ආදිය විවිධ රටවල්වලට අයත් ඒවා වන අතර ඒවායේ පරිපාලනය ක්‍රියාත්මක වන්නේ අදාළ සංවිධාන ජාලයේ අධිකාරිත්වයට යටත් ව ය. මේ අනුව ආර්ථික ගෝලීයකරණය යනු ලෝක ගෝලීයකරණ ක්‍රියාවලියේ ඉතා වැදගත් සහ පුළුල් ම අංශය බව පෙන්වා දිය හැක. බ්‍රිතාන්‍ය යටත් විජිත තත්ත්වයෙන් නිදහස ලැබීමෙන් අනතුරු ව ශ්‍රී ලංකා ජාතික ආර්ථිකය ගෝලීය ආර්ථික සෙවනැල්ල ඔස්සේ විකාශනය වනු දැක ගත හැකි ය. එහි වර්තමාන ස්වභාවය හා විවිධ සාධනීය සහ නිශේධනීය පැතිකඩයන් පිළිබඳ ව විග්‍රහ කිරීම ඉදිරි පරිච්ඡේද තුළ දී සිදු වේ.

## ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ගෝලීයකරණ ප්‍රවණතා

ඉන්දියන් සාගරය මැද පිහිටා ඇති ශ්‍රී ලංකාව කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියන රටක් වන අතර ඈත ඉතිහාසයේ සිට ම එය විදේශයන් සමඟ විවිධ ස්වරූපයෙන් සබඳතා පැවැත් වූ බවට තහවුරු කරන ඓතිහාසික මූලාශ්‍ර බොහෝ ය. ශ්‍රී ලංකාව යටත්විජිතයක් බවට පත්වීම එහි උපරිම අවස්ථාවකි. මෙම ලිපිය තුළ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රමය ගෝලීයකරණය වීම පිළිබඳ ව විවරණය කිරීමට අපේක්ෂිත ය. පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ගෝලීයකරණයට පසුබිම සපයනු ලබන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය වේ. බ්‍රිතාන්‍යයන් මෙ රටට පැමිණ තේ, කුරුඳු වැනි කෘෂි බෝග ආශ්‍රිත ව වතු වගාව ආරම්භ කිරීම ශ්‍රී ලංකාව ආර්ථික අපනයන ක්ෂේත්‍රයට නැඹුරු වීමට මූල බීජය විය. මේ හැරුණු විට 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හරහා රජයේ වෙළෙඳ ඒකාධිකාරිය බිඳ දැමීම මෙ රට ජාතික ආර්ථිකය ජාත්‍යන්තරයට විවෘත වීමට බලපෑ තවත් සාධකයක් වේ. මෙ වැනි පසුබිමක් තුළ පශ්චාද් නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීයකරණය වී ඇත්තේ කෙසේ ද?, එහි සාධනීය නිශේධනීය පැතිකඩයන් මොනවා ද? යන්න පිළිබඳ ව විග්‍රහ කිරීම එ තරම් පහසු කාර්යයක් නො වේ. 1948 වසරේ නිදහස ලැබීමේ සිට 1970 දක්වා කාලය තුළ මෙ රට ප්‍රතිපත්ති සම්පාදකයන් මධ්‍යස්ථ ආර්ථික ප්‍රතිපත්තියක් අනුග මනය කළ අතර 1970 - 1977 දක්වා කාලය තුළ ආවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදි. එතැන් පටන් අද දක්වා ම විවෘත ආර්ථික ප්‍රතිපත්ති ඔස්සේ ශ්‍රී ලංකාවේ සමාජය ශීඝ්‍රයෙන් ගෝලීයකරණයට නතු වෙමින් සිටී. මෙ රට පිහිටීම, විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම, පරිගණක සාක්ෂරතාව වේගයෙන් ඉහළ යෑම, ප්‍රවාහන අංශයේ දියුණුව යන කරුණු ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථිකය ගෝලීයකරණය වීමට බලපා ඇත. තිස් අවුරුදු යුද්ධය ශ්‍රී ලංකාවේ ගෝලීයකරණ ක්‍රියාවලිය සඳහා යම් සංරෝධකයක් ලෙස බලපෑව ද මේ වන විට එය ද අවසන් වී ඇත. 1994 වර්ෂයේ දී රටේ ආනයන හා අපනයනවලට අදාළ විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීම ජාතික ආර්ථිකය ගෝලීයකරණයවීම ශීඝ්‍ර වීමට හේතු විය. මෙවැනි පසුබිමක් තුළ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීයකරණය වීමට බලපෑ ප්‍රධාන සාධකය වන විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීම ගැඹුරු විමර්ශනයකට ලක් කළ යුතු ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ සාධක වෙළෙඳපොළ මෙන් ම භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ ද ගෝලීයකරණය වීම සඳහා 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ආරම්භ කළ මහ කොළඹ ආර්ථික කොමිසමේ පහත සඳහන් ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග ඍජු ව බලපා ඇත.

1. කර්මාන්ත අරඹන ආයෝජකයන්ට අවුරුදු 10ක් වන තෙක් 100%ක බදු විරාමයක් ලබා දීම. කර්මාන්තයට ලැබෙන වැදගත්කම, තාක්ෂණික ස්වරූපය හා ලබා දෙන සේවා නියුක්තියේ ප්‍රමාණය අනුව ලැබෙන මෙම බදු විරාමය තවදුරටත් දීර්ඝ කිරීමට හැකියාව ලැබීම.

2. නිදහස් වෙළෙඳ කලාපයේ කොටස් මෙ රට හෝ පිටරට අයටත් අලෙවි කළ හැකි වන අතර එය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

3. කර්මාන්තකරුවන් ලබන සියලු ලාභ බද්දෙන් නිදහස් කිරීම.

4. කර්මාන්ත සඳහා යොදා ගැනෙන ප්‍රාග්ධනය, අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර සඳහා බදු අය නො කිරීම.

5. කර්මාන්ත අරඹා වසර 10ක් ගත වූ පසු ව තවත් අවුරුදු 5ක් යන තෙක් ම එම ප්‍රාග්ධනයෙන් බදු වශයෙන් අය කරනු ලබන්නේ 2% සිට 5% දක්වා අතර ගණනක් පමණ ය.

6. බදු නිදහස් කාල සීමාව තුළ දී සේවයේ යොදා ගන්නා විදේශීය සේවකයන්ගේ ආදායම් ද ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

7. එම කාලය තුළ කොටස්කරුවන් ලබන ලාභ සඳහා ද බදු අය නොකිරීම.

8. කලාපය තුළ අරඹන කර්මාන්ත සඳහා රටින් පිටට ගෙන යන නිෂ්පාදන අයිතිය සඳහා වන මුදල් වෙනුවෙන් ද බදු අය නො කිරීම.

මහ කොළඹ ආර්ථික කොමිසම විසින් ඉහත ආකාරයේ බදු සහනයන් හා වෙනත් පහසුකම් සැලසීම තුළින් විදේශ ආයෝජන දිරිමත් කිරීම, කර්මාන්ත ආශ්‍රිත දැනුම මෙ රටට ගලා ඒම, විදේශ වෙළෙඳාම පුළුල් වීම ආදී විවිධ අංශයන්ගෙන් මෙ රට ආර්ථිකය ගෝලීයකරණය කිරීමට පසුබිම සපයන ලදි. මෙ වැනි විවිධ හේතු කාරණා මත, පශ්චාද් නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විවිධ අංශයන්ගේ ගෝලීයකරණය වීමේ ස්වරූපය පිළිබඳ ව ආර්ථික දත්තයන් විශ්ලේෂණය කිරීමෙන් හඳුනා ගත හැකි ය.

පශ්චාද් නිදහස් ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමේ විකාශනය පිළිබඳ ව සලකා බලන විට එය ක්‍රමික ව ගෝලීය ආර්ථික රටාව සමඟ පුළුල් ව සම්බන්ධ වන අයුරු දැක ගත හැකි ය.

**වගු අංක 1**
**තෝරා ගත් වර්ෂ කිහිපයක ආනයන හා අපනයන**

(එක්සත් ජනපද ඩොලර් මිලියන)

| වර්ෂය | අපනයන | ආනයන |
|---|---|---|
| 1950 | 296.5 | 246.3 |
| 1955 | 397.5 | 310.4 |
| 1960 | 377.2 | 421.3 |
| 1965 | 400.9 | 403.6 |
| 1970 | 338.7 | 391.8 |
| 1975 | 563.4 | 767.3 |
| 1980 | 1,064.7 | 2,051.2 |
| 1985 | 1,315.3 | 2,044.3 |
| 1990 | 1,983.9 | 2,686.4 |
| 1995 | 3,806.6 | 5,311.1 |
| 2000 | 5,522.3 | 7,319.8 |
| 2005 | 6,346.7 | 8,863.2 |
| 2010 | 8,625.8 | 13,450.9 |
| 2015 | 10,504.9 | 18,934.6 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

1950 දී අපනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 296.5ක් වූ අතර ආනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 246.3ක් විය. 1975 වන විට අපනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 563.4ක් දක්වා ද ආනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 767.3ක් දක්වා ද වර්ධනය විය. ඉහත කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම එ තරම් ශීඝ්‍රගාමී ව වර්ධනය නො වූ බවක් හඳුනා ගත හැකි ය. එහෙත් 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ ම මෙ රට භාණ්ඩ වෙළෙඳපොළ ඉතා ශීඝ්‍රයෙන් ගෝලීය ආර්ථිකය සමඟ වර්ධනය වී ඇති බව ඉහත වගුවේ 1980 වර්ෂයේ අපනයන සහ ආනයන ප්‍රමාණ පිළිබඳ ව සලකා බැලීමෙන් පැහැදිලි වේ. 2016 වර්ෂයේ දී සමස්ත අපනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 10,000 ඉක්මවා ඇති අතර ආනයන එක්සත් ජනපද ඩොලර් මිලියන 18,000 ඉක්මවා ඇත. මේ අනුව පැහැදිලි වන්නේ මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ භාණ්ඩ වෙළෙඳපොළ ඉතා ශීඝ්‍රයෙන් ගෝලීයකරණය වී ඇති බව ය.

ඉහත දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් ගෝලීයකරණයට නතු වන බවක් දක්නට ලැබුණ ද සිංගප්පූරුව හා මලයාසියාව වැනි රටවලට සාපේක්ෂ ව එය සැලකිය යුතු අයුරින් ප්‍රසාරණය නො වී ඇති බවක් දක්නට ලැබේ.

මෙම වගුවට අනුව 2015 වන විට ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම හා අපනයන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ඉතා කුඩා අගයක් පෙන්නුම් කරන අතර සිංගප්පූරුව හා මලයාසියාවේ එය දළ දේශීය නිෂ්පාදිතය ඉක්මවා යෑමට සමත් වී ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳපොළ සැලකිය යුතු අයුරකින් ගෝලීය ආර්ථිකය සමඟ ගනුදෙනු කිරීමට සමත් ව නැති බව මෙන් ම එය ගෝලීය ආර්ථිකය තුළ තවදුරටත් ප්‍රසාරණය කර ගැනීමේ අවශ්‍යතාව ද පිළිබිඹු කරයි.

ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළෙඳපොළ පමණක් නොව ආයෝජන ක්ෂේත්‍රය ද ආර්ථිකයේ ගෝලීයකරණ නැඹුරු ව පෙන්නුම් කරන තවත් වැදගත් අංශයකි. 1950 දී ශ්‍රී ලංකාවේ ඍජු විදේශ ආයෝජන ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන -0.4ක් වූ අතර එය 1975 දී එක්සත් ජනපද ඩොලර් මිලියන -0.1 දක්වා සුළු වශයෙන් වර්ධනය විය. මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ආයෝජන ක්ෂේත්‍රය එ තරම් ගෝලීය ආර්ථික ජාලය සමඟ සම්බන්ධ නො වූ බවක් දක්නට ලැබේ.

**වගු අංක 2**

**ශ්‍රී ලංකාව, මලයාසියාව සහ සිංගප්පූරුව විදේශ වෙළෙඳාමේ ප්‍රසාරණය**

| රට | ශ්‍රී ලංකාව | | මලයාසියාව | | සිංගප්පූරුව | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | විදේශ වෙළෙඳාම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | විදේශ වෙළෙඳාම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | විදේශ වෙළෙඳාම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස |
| 2010 | 46.36 | 19.55 | 157.94 | 86.93 | 372.10 | 199.26 |
| 2011 | 54.98 | 20.90 | 154.94 | 85.26 | 377.30 | 200.93 |
| 2012 | 51.49 | 19.82 | 147.84 | 79.30 | 367.14 | 195.39 |
| 2013 | 49.26 | 20.32 | 142.69 | 75.61 | 361.59 | 192.35 |
| 2014 | 49.83 | 20.91 | 138.46 | 73.85 | 359.77 | 192.11 |
| 2015 | 48.48 | 20.53 | 134.36 | 71.00 | 326.12 | 176.49 |

මූලාශ්‍රයඃ ලෝක සංවර්ධන දර්ශකය, ලෝක බැංකුව

එහෙත් මහ කොළඹ ආර්ථික කොමිසම මගින් ලබා දුන් බදු සහන සහ අනෙකුත් පහසුකම් පදනම් කොට ගෙන ජාත්‍යන්තර ආයෝජන මෙ රටට ගලා ඒම ශීඝ්‍රයෙන් වර්ධනය විය. එනම් 1975 දී සෘණ අගයක පැවති මෙ රට සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය 1980 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 42.9 දක්වා ඉතා ශීඝ්‍රයෙන් වැඩි විය. එ තැන් පටන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා ප්‍රාග්ධනය සපයා ගැනීම ගෝලීය ආර්ථිකය සමඟ විශාල වශයෙන් බද්ධ වන අයුරු දැක ගත හැකි ය. මෙම තත්ත්වය 2015 වර්ෂය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 681.2 දක්වා ඉහළ ගොස් ඇති අතර ගෝලීය ව්‍යාපාර ජාලය තුළ ආයෝජන කටයුතුවල නිරත වන විදේශ ආයෝජකයන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට ක්‍රමයෙන් පෙළඹෙන බවක් දැක ගත හැකි ය. ඉහත සංඛ්‍යාලේඛනවලට අනුව අවබෝධ වන කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ආයෝජන ක්ෂේත්‍රය හරහා ද ගෝලීයකරණය වෙමින් පවතින බව ය.

මෑත වකවානුව වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීයකරණය වීම පිළිබිඹු වන තවත් අංශයක් ලෙස ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය පෙන්වා දිය හැකි ය. 2007 වර්ෂය වන විට රැකියා සඳහා දිනකට පුද්ගලයන් 599 දෙනෙක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් පිටව යයි. එය 2014 වන විට 823 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම තොරතුරුවලින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව තුළ ශ්‍රම ගලනය ගෝලීයකරණ ප්‍රවණතාවල බලපෑමෙන් සිදු වන බවයි. ඉහත තොරතුරු සියල්ල සලකා බලන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ සෑම අංශයක් ම පාහේ ගෝලීයකරණ ක්‍රියාවලියට නතු වූ බව සනාථ වේ. මෙහිලා මීළඟට වැදගත් කරුණ වන්නේ ආර්ථිකය ගෝලීයකරණය වීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවට කෙසේ බලපා ඇද්ද යන්න සොයා බැලීමයි.

## ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීයකරණය වීමේ සාධනීය සහ නිෂේධනීය බලපෑම

ඉහත පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් ගෝලීයකරණය වී ඇති බව විවාදයකින් තොර ව පිළිගැනීමට ලක් වූ කරුණකි. මෙසේ ආර්ථිකය ගෝලීයකරණය වීමේ බලපෑම සාධනීය මෙන් ම නිෂේධනීය ද විය හැකි ය. මෙ රට ජාතික ආර්ථිකයට ගෝලීයකරණයේ සාධනීය බලපෑම විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පහත පරිදි විග්‍රහ කළ හැකි ය.

පශ්චාද් නිදහස් ශ්‍රී ලංකාවේ මුළු විදේශ වත්කම් ප්‍රමාණය ආර්ථිකය ගෝලීයකරණය වීමත් සමඟ ම පහළ මට්ටමක සිට ඉහළ මට්ටමක් දක්වා ගමන් කරනු දැකිය හැකි ය.

**වගු අංක 3**
**තෝරා ගත් වර්ෂ කිහිපයක විදේශ වත්කම්**

(රුපියල් මිලියන)

| වර්ෂය | මුළු විදේශ වත්කම් ප්‍රමාණය | වර්ෂය | මුළු විදේශ වත්කම් ප්‍රමාණය |
|---|---|---|---|
| 1950 | 237.6 | 1985 | 672.0 |
| 1955 | 258.2 | 1990 | 856.7 |
| 1960 | 114.0 | 1995 | 2901.9 |
| 1965 | 92.1 | 2000 | 2131.2 |
| 1970 | 67.6 | 2005 | 4200.5 |
| 1975 | 108.1 | 2010 | 8620.8 |
| 1980 | 375.9 | 2015 | 9336.9 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

ඉහත වගුවට අනුව පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ මුළු විදේශ වත්කම් ප්‍රමාණය 1950 සිට 1975 දක්වා ඩොලර් මිලියන 237.6 සිට 108.1 දක්වා පරාසයක් තුළ විචලනය වෙමින් පැවැති බව පැහැදිලි වේ. එහෙත් විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමත් සමග ම මෙ රට ආර්ථිකය ගෝලීයකරණයට ලක්වීමේ ප්‍රතිඵලයක් ලෙස මුළු විදේශ වත්කම් ප්‍රමාණය ශීඝ්‍ර වශයෙන් ඉහළ යෑම ආරම්භ වී ඇත. ආවෘත ආර්ථික ප්‍රතිපත්ති පැවැති අවසන් යුගයේ එ නම් 1975 ඩොලර් මිලියන 108.1ක් ව පැවැති මුළු විදේශ වත්කම් ප්‍රමාණය 1977 ට පසු විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමග ම 1980 වර්ෂය වන විට ඩොලර් මිලියන 375.9ක් දක්වා ඉහළ ගොස් ඇත. එය 2010 වන විට ඩොලර් මිලියන 8620.8ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම දත්තයන්ට අනුව පැහැදිලි වන කරුණ වන්නේ මෙ රට ජාතික ආර්ථිකය වේගයෙන් ගෝලීයකරණය වීම මුළු විදේශ වත්කම් ප්‍රමාණය ඉහළ යෑමට සාධනීය ලෙස බලපා ඇති බවයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීයකරණය වීම මෙ රට ශ්‍රම වෙළෙඳපොළ කෙරෙහි ද සාධනීය අයුරින් බලපා ඇත. සමස්ත විරැකියා අනුපාතය නිදහස් ආර්ථිකය හඳුන්වා දීම ඇතුළු කරුණු රාශියක් මත ක්‍රමයෙන් අඩු වන බවක් දක්නට ලැබේ. මෙහි විශේෂිත ලක්ෂණය වන්නේ කාන්තා ශ්‍රම වෙළෙඳපොළ සහභාගිත්වය ගෝලීයකරණය වීම වේගවත් වීම සමග ම ඉහළ යෑමක් පෙන්නුම් කිරීමයි.

**වගු අංක 4**
**තෝරාගත් වර්ෂ කිහිපයක ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා වියුක්ති අනුපාතය**

| වර්ෂය | සමස්තය (%) | ස්ත්‍රී (%) | පුරුෂ (%) | වර්ෂය | සමස්තය (%) | ස්ත්‍රී (%) | පුරුෂ (%) |
|---|---|---|---|---|---|---|---|
| 1963 | 16.6 | 20 | 15.3 | 1985 | 14.1 | 20.8 | 10.8 |
| 1968 | 14.3 | 20.1 | 11.2 | 1990 | 15.9 | 23.4 | 11.8 |
| 1971 | 18.7 | 31.1 | 14.3 | 1995 | 12.3 | 18.7 | 9.0 |
| 1973 | 18.3 | 26.8 | 13.7 | 2000 | 7.6 | 11.0 | 5.8 |
| 1975 | 19.7 | 33.1 | 14.3 | 2005 | 7.7 | 11.9 | 5.5 |
| 1978 | 14.8 | 24.9 | 9.2 | 2010 | 4.9 | 7.7 | 3.5 |
| 1981 | 17.9 | 31.0 | 13.3 | 2014 | 4.3 | 6.5 | 3.1 |
| 1982 | 11.7 | 21.3 | 7.8 | 2015 | 4.6 | 7.6 | 3.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

ඉහත දත්තයන්ට අනුව, ගෝලීයකරණ ප්‍රවණතා ඉහළ යාමත් සමඟ ම සමස්ත විරැකියා අනුපාතයේ ද අඩු වීමක් දක්නට ලැබේ. ඒ හැරුණු විට ඉහළ ම කාන්තා විරැකියා අනුපාතයක් පෙන්නුම් කරනු ලබන්නේ මෙ රට ආර්ථිකය ගෝලීයකරණය වීම සීමා වූ අවදියක් වන 1970 - 1977 අතර කාලය තුළ දී ය. එ නම් 1975 කාන්තා සේවා වියුක්ති අනුපාතය 33.1% ක් විය. තවදුරටත් සලකා බලන විට කාන්තා සේවා වියුක්ති අනුපාතය 20% ට වඩා අඩු අගයක් පෙන්නුම් කරනුයේ ද 1995 වර්ෂයේ පමණ සිට ය. සමස්ත ශ්‍රම වෙළෙඳපොළේ මෙන් ම කාන්තාවන් ශ්‍රම වෙළෙඳපොළට සහභාගී වීම ඉහළ යෑම විෂයෙහිලා විදේශ ප්‍රාග්ධනය මෙ රටට ගලා ඒම, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ මතවාදය නව්‍යකරණය වීම වැනි ගෝලීයකරණ සංරචකයන්ගේ බලපෑම හේතු වී ඇත. මේ අනුව, ශ්‍රම වෙළෙඳපොළ අසමානතා පහළ යෑමට සහ සමස්ත රැකියා නියුක්තිය ඉහළ යෑමට මෙ රට ආර්ථිකය ගෝලීයකරණය වීම බලපා ඇති බව මනාව පැහැදිලි වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිත තත්ත්වයක් කරා ගමන් කිරීමේ දී ඒවා කෘෂිකාර්මික නිෂ්පාදකයන්ගේ සිට කාර්මික හා සේවා නිෂ්පාදන පදනම් කරගත් ආර්ථිකයන් දක්වා විතැන් වීම සුලභ ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද, පශ්චාද් නිදහස් යුගය තුළ මුල් වකවානුවට අනුව බලන විට කෘෂිකාර්මික අංශයට සාපේක්ෂ ව කාර්මික හා සේවා අංශ වර්තමානය වන විට ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි.

නිදහසින් පසු මුල් යුගයේ දී ශ්‍රී ලංකා දළ දේශීය නිෂ්පාදිතයේ විවිධ අංශයන්ගේ දායකත්වය සලකා බලන විට ඉන් අඩකට ආසන්න ප්‍රමාණයකට දායක වී ඇත්තේ කෘෂිකාර්මික අංශයයි. දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය, කෘෂිකාර්මික අංශයේ දායකත්වය අඛණ්ඩ ව ඉක්මවා යනු ලබන්නේ 1995 වර්ෂයේ දී ය. එ නම් එම වසරේ කෘෂිකාර්මික අංශයේ දායකත්වය 23.0% ක් වන විට කාර්මික අංශයේ දායකත්වය 26.5% ක් විය. මෙය ඉතා සුළු වශයෙන් සිදු වූ වෙනස්වීමක් පමණි. 2015 වන විට මෙම තත්ත්වය තවත් ඉදිරියට වර්ධනය වී ඇත. එ නම් කෘෂිකාර්මික අංශයේ දායකත්වය 8.1% ක් වන විට කාර්මික අංශයේ දායකත්වය 28.5% දක්වා වර්ධනය විය. වර්තමානය වන විට ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටකි. බොහෝ මැදි ආදායම් ලබන රටවල් මැදි ආදායම් උගුලේ සිරවීමට හේතු වන්නේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික රටාවේ සිට නවීන කාර්මික නිෂ්පාදන රටා දක්වා විතැන් වීමට ඇති අසීරුතාවයි. ශ්‍රී ලංකාවට ද නිදහසින් පසු මුල් වකවානුවේ පැවැති තරමක් ලිහිල් නො වූ ආර්ථික ප්‍රතිපත්තිය සහ ජනවාර්ගික අර්බුදය මෙ රටට විදේශ ආයෝජකයන් පැමිණ කර්මාන්ත අංශය වර්ධනය වීමට සංරෝධකයක් ලෙස පැවතින. නිදහස් ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස ගෝලීය ආර්ථික රටාවක් සමඟ ක්‍රමයෙන් ඒකාබද්ධ වීම වැඩි වීම ඉහළ යෑම ශ්‍රී ලංකා දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික දායකත්වයේ කාර්මික අංශයේ සහ සේවා අංශවල දායකත්වය වැඩි වීමට හේතු විය. මෙම තත්ත්වය ආර්ථිකය ගෝලීයකරණය වීමෙන් මෙ රට ආර්ථිකයේ ඇති වූ තවත් යහපත් ප්‍රවණතාවක් වන

**වගු අංක 5**

**දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස**

| වර්ෂය | කෘෂි අංශය(%) | කාර්මික අංශය (%) | සේවා අංශය (%) | වර්ෂය | කෘෂි අංශය(%) | කාර්මික අංශය (%) | සේවා අංශය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1950 | 46.3 | 19.6 | 36.9 | 1985 | 27.7 | 26.2 | 46.1 |
| 1955 | 45.9 | 16.5 | 39.6 | 1990 | 26.3 | 26.0 | 47.7 |
| 1960 | 37.8 | 16.8 | 45.4 | 1995 | 23.0 | 26.5 | 50.5 |
| 1965 | 33.6 | 17.4 | 49.0 | 2000 | 19.9 | 27.3 | 52.8 |
| 1970 | 28.3 | 23.8 | 47.9 | 2005 | 11.8 | 30.2 | 58.0 |
| 1975 | 30.4 | 26.4 | 43.2 | 2010 | 8.5 | 26.6 | 54.6 |
| 1980 | 27.6 | 29.6 | 42.8 | 2015 | 8.1 | 28.5 | 56.3 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

අතර වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින සාමකාමී තත්ත්වය තුළින් විදේශ ආයෝජන දියුණු කිරීම හරහා මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් පියවර ගත යුතු ය. ආර්ථිකයේ කාර්මික අංශයේ ඉදිරි වේගවත් වර්ධනය මැදි ආදායම් උගුලින් ගැලවීමට ශ්‍රී ලංකාවට ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය කරුණක් වන අතර ම මෙ රට ආර්ථිකය ගෝලීයකරණය වීම තුළින් මෙ රට ආර්ථිකයේ සිදුවෙමින් පවතින ක්‍රමික පරිවර්තනය තවදුරටත් පවත්වාගෙන යෑම ආර්ථිකය ගෝලීයකරණය වීමෙන් ලබා ගත හැකි තවත් යහපත් ප්‍රතිඵලයකි.

රටක ආර්ථිකය ගෝලීයකරණය වීම තුළ ඉහත ආකාරයේ යහපත් ප්‍රවණතා මෙන් ම ආර්ථිකයට අහිතකර ප්‍රවණතා ඇති වීම ද නිසැක වශයෙන් ම දැක ගත හැකි තත්ත්වයකි. මෙ රට ආර්ථිකය වේගයෙන් ගෝලීයකරණය වන විට දේශීය කර්මාන්ත අධෛර්යමත් වීම, ළදරු කර්මාන්ත බිඳ වැටීම එ වැනි එක් ආර්ථිකමය දුර්වලතාවක් ලෙස හැඳින්විය හැකි ය. 1977 වර්ෂයේ දී නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමත් සමග ම එ තෙක් ශක්තිමත් ව පැවති ලෝහ, කඩදාසි, රෙදිපිළි ආදී කර්මාන්ත ක්‍රමික ව බිඳ වැටීමට පත් වූ බව වික්ටර් අයිවන් විසින් රචිත අර්බුදයේ ගමන් මග කෘතිය තුළ පෙන්වා දී ඇත. මෙකී තත්ත්වයේ අහිතකර ආර්ථික ප්‍රතිඵලයක් ලෙස අපනයනවලට සාපේක්ෂ ව ආනයන ශීඝ්‍රයෙන් වැඩිවීමක් දක්නට ලැබුණු අතර එය ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයට අහිතකර ලෙස බලපා ඇත.

1950 සිට 1975 අතර කාලය තුළ මෙ රට වෙළෙඳ ශේෂය ඉතා සුළු විචලනයක් සහිත ව ධන අගයක සිට ඍණ අගයක් දක්වා ගමන් කළ බව දැක ගත හැකි ය. එහෙත් නිදහස් ආර්ථික ප්‍රතිපත්තියෙන් පසුව වෙළෙඳ ශේෂය ඍණ වීම ඉතා ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතින බව දැක ගත හැකි ය. 1975 දී ඇමරිකානු ඩොලර් මිලියන 203.9 ක් ව පැවැති වෙළෙඳ ශේෂ පරතරය 1980 වන විට ආසන්න වශයෙන් පස් ගුණයක් එ නම් ඇමරිකානු ඩොලර් මිලියන 986.5 දක්වා ඉහළ ගොස් ඇත. නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය හමුවේ දේශීය කර්මාන්ත බිඳ වැටීමත් ඒ හරහා අපනයන අඩාල වීමත් හේතු කොට ගෙන ආනයනික භාණ්ඩ ප්‍රමාණය සඳහා වන වියදම වැඩි වීම මෙකී තත්ත්වයට හේතු වී ඇත. 2015 වර්ෂය වන විට ආනයනික භාණ්ඩ සඳහා වන වියදම අපනයන භාණ්ඩවලින් ලැබෙන ආදායමට සාපේක්ෂ ව දෙගුණයකට ආසන්න වී ඇත. ආර්ථිකයේ ගෝලීයකරණය තුළ දේශීය නිෂ්පාදනය අඩු වී විදේශ භාණ්ඩ මෙ රටට ගලා ඒම තුළ ජංගම ගිණුමේ ශේෂය මත වන පීඩනය වැඩි වීම මෙම තත්ත්වයට උපකාරී වී ඇත.

ඉහත සංසිද්ධියේ ප්‍රතිඵලයක් ලෙස මෙ රට ආර්ථිකය ගෝලීයකරණය වීම සමස්ත විදේශ ණය ප්‍රමාණය ඉහළ යාමට ද හේතු පාදක විය. අපනයන ආදායමට සාපේක්ෂ ව ආනයන වියදම වැඩි වන විට එකී අධි ආනයන ඉල්ලුමට අදාළ වියදම් පියවීමට විදේශීය ණය ලබා ගැනීමට සිදු වේ. මේ හැරුණු විට නව කර්මාන්ත ශාලා ආරම්භ කිරීමට අධ්‍යාපන, සෞඛ්‍යය ආදී සමාජ

**වගු අංක 6**

**තෝරාගත් වර්ෂ කිහිපයක ආනයන අපනයන වෙළෙඳ ශේෂ පරතරය**

| වර්ෂය | අපනයන | ආනයන | වෙළඳ ශේෂ පරතරය | වර්ෂය | අපනයන | ආනයන | වෙළඳ ශේෂ පරතරය |
|---|---|---|---|---|---|---|---|
| 1950 | 296.5 | 246.3 | 50.2 | 1985 | 1315.3 | 2044.3 | -729 |
| 1955 | 397.5 | 310.4 | 87.1 | 1990 | 1983.9 | 2686.4 | -702.5 |
| 1960 | 377.2 | 421.3 | -44.1 | 1995 | 3806.6 | 5311.1 | -1504.5 |
| 1965 | 400.9 | 403.6 | -2.7 | 2000 | 5522.3 | 7319.8 | -1797.5 |
| 1970 | 338.7 | 391.8 | -53.1 | 2005 | 6346.7 | 8863.2 | -2516.5 |
| 1975 | 563.4 | 767.3 | -203.9 | 2010 | 8625.8 | 13450.9 | -4825.1 |
| 1980 | 1064.7 | 2051.2 | -986.5 | 2015 | 10504.9 | 18934.6 | -8429.7 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

සංවර්ධන කටයුතු සඳහා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විදේශීය ණය ලබා ගැනීමට සිදු වී ඇත. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ ණය අනුපාතය නිදහස් ආර්ථික ප්‍රතිපත්තියෙන් පසු ව වේගයෙන් ඉහළ යන බව දැක ගත හැකි ය.

**වගු අංක 7**
**තෝරා ගත් වර්ෂ කිහිපයක විදේශීය ණය අනුපාතය**

(දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)

| වර්ෂය | විදේශීය ණය අනුපාත | වර්ෂය | විදේශීය ණය අනුපාත |
|---|---|---|---|
| 1950 | 3.2 | 1985 | 57.6 |
| 1955 | 3.9 | 1990 | 72.0 |
| 1960 | 4.4 | 1995 | 66.7 |
| 1965 | 6.0 | 2000 | 54.5 |
| 1970 | 18.3 | 2005 | 46.5 |
| 1975 | 19.2 | 2010 | 37.8 |
| 1980 | 41.4 | 2015 | 54.4 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

ඉහත සංඛ්‍යාලේඛනවලට අනුව 1950 සිට 1975 අතර කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ ව විදේශීය ණය අනුපාතය 20% ඉක්මවා නැත. 1975 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 19.2%ක ප්‍රමාණයක් වූ විදේශ ණය ප්‍රතිශතය 1980 වන විට දෙගුණයකට වඩා විශාල ප්‍රමාණයකින් එ නම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 41.4%ක ප්‍රතිශතයක් දක්වා ඉහළ ගොස් ඇත. වර්තමානය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් විදේශ ණය ප්‍රමාණය 50% ඉක්මවා ඇත. එනම් 2015 වර්ෂයේ දී 54.4% දක්වා ඉහළ ගොස් ඇත. ආර්ථිකය ගෝලීයකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස උග්‍ර වශයෙන් විදේශ ණය ප්‍රමාණය ඉහළ යෑම මෙ රට ආර්ථිකය ණය උගුලේ පැටලීමට ඇති අවදානම වැඩි කරනු ලබයි. මේ අනුව ගෝලීයකරණය තුළ ආර්ථිකයට සිදු වන තවත් අයහපත් ප්‍රතිඵලයක් ලෙස මෙ රට ආර්ථිකයේ ණය බර ඉහළ යෑම පෙන්වයි. මෙ වැනි තත්ත්ව මූල්‍ය අර්බුදවලට ද මග පෑදිය හැකි කරුණු වේ.

ඉහත සමස්තයේ අවසන් ප්‍රතිඵලය වන්නේ රාජ්‍ය අයවැය පරතරය ක්‍රමික ව විශාල වීමයි. රජයේ සමස්ත වියදම් ප්‍රමාණය පියවා ගැනීමට තරම් රජයේ ආදායම් මට්ටම ප්‍රමාණවත් නො වීම හේතුවෙන් රාජ්‍ය අයවැය හිඟය ඉහළ යෑම සිදු වේ. ඉහතින් සඳහන් කළ ආකාරයට වෙළෙඳ ශේෂය ඍණ අගයක් දක්වා ගමන් කිරීම, රාජ්‍ය ණය බර ඉහළ යාම, ඒ මත ගෙවීමට සිදු වන පොලිය අධික වීම, රජයේ සුබසාධන වියදම් ආදිය රාජ්‍ය වියදම් ඉහළ යෑමට උපකාරී වන අතර රාජ්‍ය ආදායමෙන් විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට ණය පියවීමට වෙන් කිරීමට සිදු වී ඇත. මෙම ගැටලුව මතු වී ඇත්තේ මෙ රට ආර්ථිකය ගෝලීයකරණය වීමේ ප්‍රවණතාව ඉහළ යාමත් සමග යැයි සිතීම අසාධාරණ නොවේ.

**වගු අංක 8**
**තෝරා ගත් වර්ෂ කිහිපයක අයවැය හිඟය හෝ අතිරික්තය**

(දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)

| වර්ෂය | රජයේ අයවැය හිඟය හෝ අතිරික්තය (%) | වර්ෂය | රජයේ අයවැය හිඟය හෝ අතිරික්තය (%) |
|---|---|---|---|
| 1950 | -4.1 | 1985 | -9.7 |
| 1955 | 2.2 | 1990 | -7.8 |
| 1960 | -6.1 | 1995 | -8.7 |
| 1965 | -5.0 | 2000 | -9.5 |
| 1970 | -6.4 | 2005 | -7.0 |
| 1975 | -6.4 | 2010 | -7.0 |
| 1980 | -19.2 | 2015 | -7.4 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

1950 සිට 1975 දක්වා රාජ්‍ය අයවැය පරතරය විශාල වශයෙන් විචලනයකට ලක් නො වූ අතර 1975 වන විට එම අගය ඍණ රුපියල් මිලියන 1698ක් පමණ විය. එහෙත් 1980 වන විට එකවර ම එය ඉතා විශාල වශයෙන් ඉහළ ගොස් ඇත. එනම් 1980 දී රාජ්‍ය අයවැය පරතරය ඍණ රුපියල් මිලියන 12746ක් දක්වා ඉහළ ගොස් ඇත. 2015 වර්ෂයේ දී රාජ්‍ය අයවැය පරතරය ඍණ රුපියල් මිලියන 830,000කට ආසන්න වී ඇත. මේ අනුව පැහැදිලි වන්නේ දේශීය ආර්ථිකය ගෝලීය වෙළෙඳපොළට විවර වීමේ ප්‍රවණතාව ඉහළ යන විට ඒ තුළ අහිතකර ප්‍රතිඵල රැසක් ඇති විය හැකි බව ය.

ඉහත කරුණු සියල්ල ම සම්පිණ්ඩනය කළ විට පැහැදිලි වන කරුණ වන්නේ රටක ආර්ථිකය ගෝලීයකරණය වන විට එම තත්ත්වය එකී ආර්ථිකයට සාධනීය මෙන් ම නිෂේධනීය අයුරින් ද බලපෑම්

ඇති කරන බවයි. මෙම ලිපියේ ඉහත ඡේද තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීයකරණය වීම සහ එහි ආර්ථිකමය යහපත් සහ අයහපත් ප්‍රතිවිපාක කිහිපයක් සීමා සහිත ව විශ්ලේෂණය කරන ලදී. ගෝලීයකරණය යනු වර්තමාන ලෝකයේ කිසිදු ආර්ථිකයකට පාහේ අත් මිදිය නො හැකි තත්ත්වයකි. එහිලා දේශීය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගෝලීයකරණය තුළ ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැගීමේ අවශ්‍යතාව පූර්ණ වශයෙන් විග්‍රහයට ලක් කළ යුතු කරුණකි.

**සාරාංශය**

මෙම ලිපියෙහි උක්ත කරුණු සියල්ල සම්පිණ්ඩනය කළ විට ගෝලීයකරණය යනු සෑම රටක ම ආර්ථික පද්ධතියට විශාල බලපෑම් කරනු ලබන ලෝක සංසිද්ධියක් බවත් එහි සෙවණැලි ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පිලිබිඹු වන බවත් ප්‍රත්‍යක්ෂ වනු නිසැක ය. ගෝලීය ආර්ථිකය තුළ ශක්තිමත් අභ්‍යන්තර ආර්ථිකයක් ගොඩ නැගීම එ තරම් පහසු කාර්යයක් නො වේ. ශ්‍රී ලංකාව ගත්විට සමාජවාදය හෝ ධනවාදය හෝ යනු මෙ රට නිෂ්පන්න ආර්ථික ක්‍රම නො වේ. එවැනි ආර්ථිකයන්වල විවිධ ලක්ෂණ ශ්‍රී ලංකා ජාතික රාජ්‍ය මත පතිත වන්නේ අඛණ්ඩ ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙසයි. මේ අනුව සලකා බලන කල ගෝලීයකරණය තුළ සාර්ථක ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කිරීමට ගෝලීයකරණ බලපෑම දේශීය වශයෙන් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව විග්‍රහ කිරීමට මෙම ලිපිය උත්සාහ කරයි. ඊට හේතු වූයේ ආර්ථික ගෝලීයකරණයෙන් අනෙකුත් සෑම ආර්ථිකයකට මෙන් ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ද ඉහත සාකච්ඡා කළ අන්දමේ යහපත් සහ අයහපත් ප්‍රතිඵල උදාකර දීමයි. ආර්ථික ගෝලීයකරණය දේශීය වශයෙන් කළමනාකරණය කිරීමේ දී පහත ගැටලුවලට ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය ය.

ගෝලීයකරණයට නතු වූ ආර්ථිකයකට බාහිර ආර්ථික සමතුලිතතාවට සාපේක්ෂ ව අභ්‍යන්තර ආර්ථික සමතුලිතතාව පවත්වාගෙන යෑම ඉතා අපහසු කාර්යයකි. එ නම් ජාත්‍යන්තර කම්පන දේශීය ආර්ථිකයට ඉතා සෘජු බලපෑම් කිරීම හේතුවෙන් දේශීය සමතුලිතතාව පවත්වාගෙන යෑම එ තරම් පහසු නොවන්නක් බවයි. උදාහරණයක් ලෙස ආචාර්ය රගුරාම් රාජන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 67 වන සාංවත්සරික දේශනය පවත්වමින් පෙන්වාදෙන අන්දමට කාර්මික රටවල වියපත් ජනගහනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඒවායේ පරිභෝජන වියදම අඩු වී එය නැගී එන ආර්ථිකයන්ගේ අපනයනයන්ට නිෂේධනාත්මක ව බලපෑම් ඇති කරන බව පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාව ද විදේශීය වෙළෙඳාමෙන් විවිධ ප්‍රතිලාභ ලබන රටක් ලෙස රාජන් පෙන්වා දෙන බැවින් ඉහත ගැටලුවට ආමන්ත්‍රණය කිරීමට පූර්ව පියවරයන් ගත යුතු ය. ශ්‍රී ලංකාවේ අපනයන දිශානතිය ගත් විට එය ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපය කේන්ද්‍ර වූ ක්‍රමෝපායකින් සැකසුනකි. එ මෙන් ම එහි කාර්මික නිෂ්පාදන අපනයනය ප්‍රමාණවත් තරම් මට්ටමක නො පවතී. ආර්ථිකය ගෝලීයකරණය වීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට නම් අපනයන පිළිබඳ වූ ඉහත ගැටලු නිරාකරණය කිරීමට ශ්‍රී ලංකාව අපනයන වෙළෙඳපොළ ප්‍රසාරණය කර ගැනීම, කාර්මික නිෂ්පාදන කරා වැඩි නැඹුරුවක් දැක්වීම ආදී ක්‍රමෝපායන්ට ප්‍රවිෂ්ට විය යුතු ය. අනෙක් අතට ගෝලීයකරණය තුළ ජාතික රාජ්‍යයක් වශයෙන් ස්වාධීන ව ගොඩ නැගීමේ දී මූල්‍ය ස්වාධිපත්‍යය ආරක්ෂා කර ගැනීමට ද හැකි වන පරිදි ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් සැකසීම ශ්‍රී ලංකාව පැත්තෙන් තවත් අත්‍යවශ්‍ය කාර්යයකි. එ නම් අධික ණය බර පදනම් කොට ඇති වන විදේශීය බලපෑමෙන් ආරක්ෂා වීමට හැකි වන පරිදි විදේශ ආයෝජන ගෙන්වා ගැනීමට හැකි වන ආකාරයේ නම්‍යශීලී මෙන් ම ආරක්ෂිත ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපනය කිරීම ගෝලීයකරණය කළමනාකරණය කරමින් එහි සාධනීය ප්‍රතිඵල ලබා ගැනීමට අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුත්තකි. ˜The Road to a Free Economy˜ කෘතිය රචනා කරමින් මහාචාර්ය යානොස් කෝර්නායි විසින් හංගේරියාව පදනම් කරගනිමින් ඉදිරිපත් කරනු ලබන පහත අදහස පිළිබඳ ව අවධානය යොමු කිරීම රටක ආර්ථිකය ගෝලීයකරණය වීම තුළ එය කළමනාකරණය කළ යුත්තේ මන්ද යන්න පිළිබඳ පෙන්වා දීමට වැදගත් වේ.

“නිලධාරිවාදී තහංචි යොදා විදේශීය ප්‍රාග්ධනය රට ගැන දක්වන උනන්දුව නැති කර දමනු වෙනුවට අප කළ යුත්තේ විදේශීය ප්‍රාග්ධනය පිළිගන්නා සීමා පැහැදිලි ව හා අවංක ව ප්‍රකාශ කිරීමත් ඕනෑවට වැඩි ආක්‍රමණශීලී යන අපේ සංකල්ප පැහැදිලි ව පෙන්වා දීමත් ය.”

මෙම අදහසට අනුව පැහැදිලි වන්නේ ආර්ථික ගෝලීයකරණය යන්න අත් හළ නො හැකි සාධකයක් බවත් එහි දී දේශීය අවශ්‍යතාව විනිවිදභාවයකින් යුක්ත ව ජාත්‍යන්තරයට නිරාවරණය කළ යුතු බවත් ය. ශ්‍රී ලංකාවට ද ආර්ථික ගෝලීයකරණය යනු මිදිය නො හැකි තත්ත්වයක් වන අතර එහි අවදානම්

කළමනාකරණය කර ගනිමින් නිවැරදි දිශානතියකට ශක්තිමත් ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් යටතේ ජාතික ආර්ථිකය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව වඩාත් තීව්‍ර ලෙස දැනෙන යුගයක් ලෙස වර්තමාන පශ්චාත් යුධ ආර්ථිකය හඳුනා ගත හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන


1. Franhel J. 2000 ˝Globalization of the Economy in J.S. Nye and J.D. Donahue (eds) Gove mance in a Globalizing world" Washington DC. The Brookings Institutions Press.
2. David Harvey, The Condition of Post modernity (Oxford:Blackwell, 1989) as cited in R.J. Holton, Globalization and the Nation-state (London: Macmillan Press, 1988) P.8
3. Anthony Giddens, The Consequences of Modernity (Cambrige: Polity Press, 1990) P.64
4. Peter Dicken, Global Shift the Internationalization of Economic Activity ^London (Gviford Press, 1992)P.1, P.87, as cited in1. Clark, Globalization and International Relations theory (New York: Oxford University Press, 1999), P.38

1. අයිවන් වික්ටර්, 2008 - අර්බුදයේ ගමන් මග
2. මහ බැංකු වාර්ෂික වාර්තාව - 2014
3. රාජන් ජී. රගුරාම් - 2015 - ලෝක මූල්‍ය පද්ධතිය සහ තරග නීති
4. ශ්‍රී ලංකා මහ බැංකුවේ 65 වැනි සංවත්සරික දේශනය - උපුටා ගැනීම - www.cbsl.gov.lk


# අලුත් සටහන්...

සටහන සඟරාවේ 2016 ජනවාරි - පෙබරවාරි සහ මාර්තු - අප්‍රේල් කලාපවලින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලේ ආරම්භය හා එහි ක්‍රමික විකාශනය පිළිබඳ මනා විවරණයක් ඉදිරිපත් කෙරෙයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශන අලෙවි කවුළුවලින් සහ ප්‍රධාන පෙළේ පොත්හල්වලින් දැන් ලබාගත හැකි ය.



# මොකක්ද මේ CAS, CEFTS කියන්නේ?

**ටී. එම්. උදයන්ති තෙන්නකෝන්**
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව



මෙම ලිපියෙහි පළමු කොටස 2015 සැප්. - ඔක්. කලාපයේ පළ විය. මෙම ලිපියෙහි අරමුණ වන්නේ ජාතික ගෙවීම් යාන්ත්‍රණයේ දැනට මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණයේ සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමයි.

## ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය [Common ATM Switch (CAS)]

ජාතික ගෙවීම් යාන්ත්‍රණයේ උප යාන්ත්‍රණ අතරින් ප්‍රථමයෙන් ම මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය මගින් ඊට සම්බන්ධ වන මූල්‍ය ආයතනවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පොදු පසුබිමක් යටතට ගෙන එමින් එම යාන්ත්‍රණයේ සාමාජිකයින් අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පොදුවේ භාවිතා කිරීමේ හැකියාව ලබාදෙනු ලබයි.

★ **යාන්ත්‍රණය මගින් සැලසෙන සේවා/පහසුකම්**

මෙම යාන්ත්‍රණයට යම් මූල්‍ය ආයතනයක් සම්බන්ධ වූ විට එම මූල්‍ය ආයතනයේ ගිණුම් හිමියන්ට එම යාන්ත්‍රණයේ සිටින වෙනත් මූල්‍ය ආයතනයක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හරහා

- තම ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට
- තම ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීමට හැකි වේ.

★ **සාමාජිකත්වය ලබාගැනීම**

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණයේ සාමාජිකත්වය දෙයාකාරයකට වර්ගීකරණය කර ඇත. සාමාජිකත්වය ලබාගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වන බලපත්‍රලාභී වාණිජ බැංකු මෙම යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකයන් ලෙස සාමාජිකත්වය ලබාගත යුතු වේ. අනෙකුත් මූල්‍ය ආයතන ද්විතියික සාමාජිකයින් ලෙස ප්‍රාථමික සාමාජිකයෙකු හරහා මෙම යාන්ත්‍රණයේ සාමාජිකත්වය ලබා ගත යුතු වේ.

මූල්‍ය ආයතනයක්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙන් මෙම යාන්ත්‍රණයේ සාමාජිකත්වය ලබාගත් පසු එම මූල්‍ය ආයතනය සතු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය "ලංකාපේ" වෙත සම්බන්ධ කෙරේ. එම නිසා එම මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්ට සිය ගනුදෙනු, සාමාජිකත්වය ලබා සිටින ඕනෑම ආයතනයක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කර ගැනීමට අවස්ථාව සැලසේ

### ★ මෙහෙයුම් කටයුතු

කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයේ ප්‍රථම අදියර ලෙස ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණයේ සජීවී මෙහෙයුම් කටයුතු 2013 ජූලි මස 23 දින රාජ්‍ය වාණිජ බැංකු දෙකෙහි එනම්, මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී.

2015 සැප්තැම්බර් මස අවසාන වන විට, මෙම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයට ප්‍රාථමික සාමාජිකයින් ලෙස බැංකු 11 ක් සම්බන්ධ වී සිටි අතර ද්විතීයික සාමාජිකයින් ලෙස එක් මූල්‍ය ආයතනයක් සාමාජිකත්වය ලබාගෙන ඇත. ඒ අනුව මෙම යාන්ත්‍රණයට සම්බන්ධ වී ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 2500 ඉක්මවා ඇති අතර මෙය මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් 80% ක් පමණ වේ.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයට දැනට සම්බන්ධ වී නොමැති මූල්‍ය ආයතන අතරින් සමහර ආයතන, එම යාන්ත්‍රණයට සම්බන්ධ වීම සඳහා සිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල තාක්ෂණික අවශ්‍යතාවන් සම්පූර්ණ කරමින් සිටී. තවත් සමහර මූල්‍ය ආයතන මෙම යාන්ත්‍රණයට සම්බන්ධ වීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමඟ සැලසුම් කරමින් සිටී.

**සංඛ්‍යා සටහන 1**
**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්:**

(2015 සැප්තැම්බර් අවසාන වන විට)

| |
|---|
| 1. මහජන බැංකුව - (2013 ජූලි 23) |
| 2. ලංකා බැංකුව - (2013 ජූලි 23) |
| 3. යූනියන් බැංකුව - (2013 සැප්තැම්බර් 05) |
| 4. සෙලාන් බැංකුව - (2014 ජනවාරි 30) |
| 5. හැටන් නැෂනල් බැංකුව - (2014 අප්‍රේල් 04) |
| 6. නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව - (2014 ජූනි 23) |
| 7. කොමර්ෂල් බැංකුව - (2014 ජූනි 27) |
| 8. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව (2014 නොවැම්බර් 24) |
| 9. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව - (2014 නොවැම්බර් 26) |
| 10. කාගිල්ස් බැංකුව - (2015 අප්‍රේල් 07) |
| 11. හබීබ් බැංකුව - (2015 මැයි 06) |
| 12. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (2015 සැප්තැම්බර් 02) (ද්විත්ව සාමාජික) |

(ඒ ඒ මූල්‍ය ආයතනය එම යාන්ත්‍රණයට සම්බන්ධ වූ දිනය වරහන් තුළ දක්වා ඇත.)

### ★ යාන්ත්‍රණය හරහා ගනුදෙනු කිරීමෙන් අත්වන වාසි

I. ගනුදෙනු පිරිවැය අඩුවීම හා විදේශ විනිමය ඉතිරි වීම.

මීට පෙර ද සඳහන් කරන ලද පරිදි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය ස්ථාපිත කිරීමට පෙර, යම් ගනුදෙනුකරුවකුට තමාගේ ගෙවීම් කාඩ්පත, එය නිකුත් කරන ලද මූල්‍ය ආයතනය හැර රට තුළ පවතින වෙනත් මූල්‍ය ආයතනයක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හරහා භාවිත කරමින් ගනුදෙනු සිදු කළ අවසථාවකදී එම ගනුදෙනු නිෂ්කාශනය ශ්‍රී ලංකාව තුළ සිදුකිරීම සඳහා පොදු යාන්ත්‍රණයක් නොතිබිණි. එමනිසා එවැනි ගනුදෙනුවල නිෂ්කාශනය ජාත්‍යන්තර ජාල සැපයුම්කරුවන් (උදා:Visa, MasterCard, Amex ආදී) මගින් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන විසින් මෙම සේවය ලබාගැනීම සඳහා එම ජාත්‍යන්තර ජාල සැපයුම්කරුවන්ට මුදල් ගෙවා පද්ධතිවල

සාමාජිකත්වය ලබා ගැනීමටත්, තම ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනුවලට අදාළ තොරතුරු ජාල හරහා හුවමාරු වීම වෙනුවෙන් සෑම ගනුදෙනු වාරයක් සඳහාම තවත් අමතර ගාස්තුවක් විදේශ විනිමය භාවිතයෙන් ගෙවීමටත් සිදු විය. ඒ අනුව, එවැනි ගනුදෙනුවක් වෙනුවෙන් ගනුදෙනුකරුවකුට රු. 50 - 200 අතර වියදමක් දැරීමට සිදුවිය. එහෙත් "ලංකාපේ" මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හඳුන්වා දීමත් සමඟ ගනුදෙනු නිෂ්කාශන කටයුතු ලංකාපේ හරහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම දේශීයව සිදුකිරීමත් සමඟ මෙම කටයුතු නිෂ්කාශනය වෙනුවෙන් වැය වූ විදේශ විනිමය ඉතිරි වේ. ඒ හේතුවෙන් මූල්‍ය ආයතනවලට ගනුදෙනුවක් වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය ද අඩු වී ඇත. ඒ තුළින් ගනුදෙනකරුවන්ට ද අඩු පිරිවැයකට සේවය සලසා ගත හැකි වී ඇත.

II. සම්පත් උපයෝජනය ඉහළ යෑම

අඩු පිරිවැයකට තම ගනුදෙනු කිරීමට හැකිවීමත් සමඟ ගනුදෙනුකරුවන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත ගනුදෙනුවලදී තම ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් වෙත ම යෑමේ නැඹුරුව අඩුවෙමින් පවතී. එය ගනුදෙනුකරුවන්ගේ කාලය ඉතිරි කරගැනීමට හේතු වේ. ඔවුන් පොදුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතා කිරීමට පෙළඹීම තුළින් රට තුළ පිහිටුවා ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) උපරිම වශයෙන් උපයෝජනය වීම සහ ඒ තුළින් යටිතල පහසුකම් පොදුවේ භාවිතා කිරීමට අවස්ථාව සැලසීම සිදුවේ.

III. ගෙවීම් ක්ෂේත්‍රය තුළ දේශීය අනන්‍යතාවක් සහිත පද්ධතියක් ස්ථාපනය වීම

මෙම යාන්ත්‍රණය ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් රට තුළ ගනුදෙනු නිෂ්කාශනය කිරීම නිසා විදේශ ජාල සැපයුම්කරුවන් මත රැඳියාව අඩුකර ගත හැකි වනු ඇත.

**ගනුදෙනු කටයුතු**


ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණය ආරම්භයේ සිට 2015 සැප්තැම්බර් දක්වා එම යාන්ත්‍රණය හරහා සිදු කළ ගනුදෙනු ප්‍රමාණය (මාසිකව) පහත සටහනෙන් දැක්වේ.

**මෙහෙයුම් කටයුතු**

මෙම යාන්ත්‍රණය හරහා කෙරෙන ගනුදෙනුවල ශුද්ධ නිෂ්කාශන ශේෂ පිළිබඳ තොරතුරු දිනකට

රූප සටහන 01

**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය හරහා සිදුකළ ගනුදෙනු ප්‍රමාණය**




දෙවරක් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව, තත්කාලින දළ පියවීම් පද්ධතිය (RTGS) හරහා දිනකට දෙවරක් එම ශුද්ධ අගයන් අදාළ වාණිජ බැංකුවලට හර හෝ බැර කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන ගෙවීම් පද්ධතිය හරහා මේ යාන්ත්‍රණයේ ශුද්ධ ශේෂයන් පියවෙන හෙයින් ගනුදෙනු පියවීම්වල අවදානම අවම වීම යාන්ත්‍රණය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු වීමට හේතු වී ඇත.

සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන"[1] නිකුත් කර ඇත.

★ **ගනුදෙනු හා ගාස්තු**

ගනුදෙනුකරුවකු, වෙනත් බැංකුවක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතා කිරීමේ දී (උදා: මුදල් ආපසු ගැනීමේ දී හෝ ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීමේ දී) ඒ වෙනුවෙන් ගනුදෙනුකරුගේ කාඩ්පත නිකුත් කළ ආයතනය (Card Issuer)

**රූප සටහන 02**
**මුදල් ආපසු ගැනීම**




★ ලංකාපේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය හරහා ගනුදෙනුකරුවකු මුදල් ආපසු ගැනීම 02 වැනි රූප සටහනෙහි දැක්වේ.

★ **නියාමනය**

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ එකී සාමාජිකයන් ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න දක්වමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "2013 අංක 01 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධිවිධාන" නිකුත් කර ඇත.
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනු කිරීමේ දී, ඒ සඳහා අය කළ හැකි උපරිම ගාස්තු පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "2014 අංක 01 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා

විසින් එම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සේවාව සැපයූ ආයතනයට, එනම්, මූල්‍ය අත්පත්කරුට (Finacial Acquirer) අන්තර් හුවමාරු ගාස්තුවක් (Interchange Fees) ද, එසේ කළ ගනුදෙනුවකට ගනුදෙනුකරුගේ බැංකුව (කාඩ්පත් නිකුත් කරන්නා) විසින් ගනුදෙනුකරුගෙන් (කාඩ්පත් හිමියාගෙන්) එම පහසුකම සැපයීම වෙනුවෙන් ගාස්තුවක් ද අයකරනු ලබයි. ඉහත සඳහන් පොදු විධිවිධාන මගින් නියම කළ පරිදි එසේ අය කළ හැකි උපරිම ගාස්තු 2 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

---

1. 2013 අංක 02 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධානය ප්‍රතිස්ථාපනය කරමින් මෙම පොදු විධිවිධානය නිකුත් කර ඇති අතර එය 2014 පෙබරවාරි 25 දින සිට බලාත්මක වේ. මෙම නව පොදු විධිවිධානයෙන් ඊට පෙර නිකුත් කළ පොදු විධිවිධානය මගින් පනවන ලද ගාස්තු සංශෝධනය කිරීමක් සිදුකර ඇත.

**සංඛ්‍යා සටහන 2:**
**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා අය කළ හැකි උපරිම ගාස්තු (බදු ඇතුළුව)**


| සේවාව/ගාස්තුව | මුදල් ආපසු ගැනීමේ එක් වාරයක් සඳහා (For cash withdrawals | ශේෂ පිරික්සුමක් සඳහා (For balance inquires) |
|---|---|---|
| කාඩ්පත් නිකුත් කරන්නකුට ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව (Max.fees charged from the customer by issuer) | Rs. 30.00 | Rs. 7.50 |
| මූල්‍ය අත්පත්කරුවකුට කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අය කළ හැකි උපරිම අන්තර් හුවමාරු ගාස්තුව (Max. interchange fee charged by financial acquirer from the card issuer) | Rs. 35.00 | Rs. 10.00 |

★ ලංකාපේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය හරහා ගනුදෙනුකරුවෙකු ශේෂය පිරික්සීමක් සිදු කිරීම 03 වැනි රූප සටහනෙහි දැක්වේ.

ඉහත ශේෂ පිරික්සුම සඳහා (03 වැනි රූප සටහන) මූල්‍ය අත්පත්කරුට එනම්, B බැංකුව) කාඩ්පත් නිකුත් කරන්නාගෙන් (එනම් A බැංකුවෙන්) අයකළ හැකි උපරිම අන්තර් හුවමාරු ගාස්තුව රු. 10.00 ක් වන අතර කාඩ්පත් නිකුත් කරන්නාට (එනම් A බැංකුව) ගනුදෙනුකරුගෙන් අයකළ හැකි උපරිම ගාස්තුව රු. 7.50 ක් වේ.

මෙසේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හඳුන්වාදීමත් සමඟ බැංකු අතර දේශීයව සිදුවන ගනුදෙනුවල නිෂ්කාශනය තවදුරටත් විදේශීය ජාල සැපයුම්කරුවන් මගින් සිදුකර ගත යුතු නොවන හෙයින් එම ජාත්‍යන්තර ජාල සැපයුම්කරුවන්ට ගෙවීමට සිදුවන විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් ගනුදෙනුකරුවන්ට අඩු පිරිවැයකට පහසුකම් ලබාගැනීමටත් හැකි වී ඇත. මේ තුළින් ජාත්‍යන්තර ජාල සැපයුම්කරුවන් මත පැවති පරායත්තතාව අඩුකර ගැනීටම හැකිවීම රටක් ලෙස වැදගත් වනු ඇත. තවද, මෙ මගින් මූල්‍ය ආයතන

**රූප සටහන 3 - ශේෂ පරීක්ෂාව**




ඉහත ගනුදෙනුව සඳහා (2 වැනි රූප සටහන) මූල්‍ය අත්පත්කරුට (B බැංකුවට) කාඩ්පත් නිකුත් කරන්නාගෙන් (එනම් A බැංකුවෙන්) අය කළ හැකි උපරිම අන්තර් හුවමාරු ගාස්තුව රු. 35.00 ක් වන අතර කාඩ්පත් නිකුත්කරන්නාට (එනම් A බැංකුවට) ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම මුදල රු. 30.00 ක් වේ.

විසින් රට තුළ ස්ථාපිත කර ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කිරීමටත් මඟ පැදී ඇත. ඒ අනුව, බැංකුවල ගනුදෙනුකරුවන් දේශීයව සිදුකරන ගනුදෙනු ශ්‍රී ලාංකික අනන්‍යතාවක් සහිත දේශීය පද්ධතියක් තුළින් නිෂ්කාශනය කිරීම ශ්‍රී ලංකාව විද්‍යුත් ගෙවීම් ක්ෂේත්‍රයේ තැබූ ජයග්‍රාහී ඉදිරි පියවරක් ලෙස හැඳින්විය හැකිය.

## විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය [Common Electronic Fund Traîfer Switch (CEFTS)

විද්‍යුත් ගෙවීම් ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් කාඩ්පත් හා ගෙවීම් ආශ්‍රිත පොදු යාන්ත්‍රණයේ දෙවන මෙන්ම වැදගත්ම උප යාන්ත්‍රණය ලෙස විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය ආරම්භ කරන ලදී.

**යාන්ත්‍රණයේ ආරම්භය**

ශ්‍රී ලංකාවේ බැංකු අතර විද්‍යුත් අරමුදල් පැවරීම් තත්කාලීනව පියවීම සඳහා ජාතික මට්ටමේ කිසිදු ක්‍රමවේදයක් මීට පෙර නොතිබුණි. එනම්,







යම් මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවකු එම මූල්‍ය ආයතනයේම වෙනත් ගනුදෙනුකරුවකුට අරමුදල් පැවරීමක් (Fund Transfer) කළ විට තත්කාලීනව දෙපාර්ශවයේ හර හා බැර වීම් සිදු වුවද එම ගනුදෙනුකරු වෙනත් බැංකුවක ගනුදෙනුකරුවකුට අරමුදල් පවරන විටෙක ඊට අදාළ ගිණුමට බැර කිරීම තත්කාලීනව කළ නොහැකි විය. ගනුදෙනුකරුවකුට තත්කාලීන ගනුදෙනුවක් කිරීමට අවශ්‍ය නම් මීට පෙර භාවිතා කළ හැකි ක්‍රමවේදය වූයේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) හරහා එය සිදු කිරීමයි. එහිදී අරමුදල් පැවරීම, එම පද්ධතියේ සාමාජික ආයතනයක් (බැංකුවක්) මගින් කළ යුතු වන අතර පහසුකම ලබාදීම ඒ ඒ බැංකුව විසින් නියම කර ඇති වේලාවන්වලට සීමා වේ. තවද, ගනුදෙනුවක් සඳහා බැංකු සැලකිය යුතු ගාස්තුවක් ගනුදෙනුකරුගෙන් අය කරයි. එබැවින් එය දෛනික සුළු පරිමාණ ගනුදෙනු සඳහා වියදම් අධික ක්‍රමවේදයක් ද වේ.

විද්‍යුත් මුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හෙවත් සෙෆ්ට්ස් ආරම්භ වීමත් සමඟ ගනුදෙනුකරුවකුට අන්තර්ජාලය හෝ ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යන ඕනෑම විද්‍යුත් ගෙවීම් මාධ්‍යයක් භාවිතා කරමින් වෙනත් බැංකුවක ගිණුම් හිමියෙකුට තත්කාලීනවම (on Real Time Basis) අරමුදල් පැවරිය හැකි වේ. මේ තුළින් ගනුදෙනු පියවීම වේගවත්ව සිදුකිරීමේ හැකියාව ගනුදෙනුකරුවන්ට ලැබේ.

**★ සාමාජිකත්වය**

යාන්ත්‍රණයේ සාමාජිකත්වය ලබාගැනීමේ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනයක් වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකයෙකු ලෙස සම්බන්ධ විය යුතු අතර අනෙකුත් මූල්‍ය ආයතන ද්විතීයික සාමාජිකත්වය ප්‍රාථමික සාමාජිකයෙකු හරහා ලබා ගත යුතු වේ.

**★ නියාමනය**

2014 අංක 2 දරන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධිවිධාන මගින් එම යාන්ත්‍රණයේ කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම හා යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් දැරිය යුතු වගකීම් හා වෙනත් පොදු කරුණු ද දක්වා ඇත. එම පොදු විධිවිධාන 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වන

වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති අතර, එය 2014 සැප්තැම්බර් 01 දින සිට බලාත්මක විය. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා කෙරෙන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ 2015 අංක 1 දරන ගෙවීම් සහ බේරුම් කිරීමේ පද්ධති චක්‍රලේඛය නිකුත් කර ඇත. එය 2015 අගෝස්තු 1 වන දින සිට බලාත්මක වේ.

★ **ගාස්තු**

විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා ගනුදෙනුකරුවකු, එක් බැංකුවකින්/මූල්‍ය ආයතනයකින්, වෙනත් බැංකුවකට/මූල්‍ය ආයතනයකට අරමුදල් පැවරීමකදී, එම ගනුදෙනුව යාන්ත්‍රණ ගාස්තුවකට (Switching Fee) ද, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා ගනුදෙනුකරුවකු වෙනත් බැංකුවක/මූල්‍ය ආයතනයක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතයෙන් ගනුදෙනුවක් කරන විට එම ගනුදෙනුව, අන්තර් හුවමාරු ගාස්තුවකට (Interchange Fee) ද යටතේ වේ. ඒ ඒ ගනුදෙනුවේ ස්වභාවය අනුව යාන්ත්‍රණ ගාස්තු සහ අන්තර් හුවමාරු ගාස්තු අය කරනු ලැබේ.

මහ බැංකුව විසින් ගනුදෙනුකරුවෙකුගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව පිළිබඳ සීමා පනවා ඇති අතර එක් ගනුදෙනු වාරයකදී පවරනු ලබන අරමුදලේ උපරිමය රුපියල් මිලියන 5 නො ඉක්මවිය යුතු ය. අදාළ ගාස්තු 03 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

- විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා ගනුදෙනුකරුවකු අරමුදල් පැවරීම 04 වැනි රූප සටහනෙහි දැක්වේ.


මෙහිදී A බැංකුවේ ගනුදෙනුකරුවකු (X ගනුදෙනුකරු) A බැංකුව සතු විද්‍යුත් ගෙවීම් මාධ්‍යයක් හරහා වෙනත් බැංකුවක ගනුදෙනුකරුවකුට එනම්, B බැංකුවේ Y ගනුදෙනුකරුට අරමුදල් පැවරීමක දී (Fund Transfer) A බැංකුව, X ගනුදෙනුකරුගේ ගිණුම හර කර එම පණිවුඩය ලංකාපේ (LankaPay) හරහා මුදල් ලබන ගිණුම්හිමියාගේ බැංකුවට (B බැංකුවට) දන්වයි. එවිට මුදල් ලබන්නාගේ බැංකුව (B බැංකුව), මුදල් ලැබිය යුතු පුද්ගලයාගේ ගිණුමට (Y ගනුදෙනුකරුට) එම මුදල් ප්‍රමාණය බැර කරයි. ගාස්තු පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ චක්‍රලේඛය අනුව, මෙම ගනුදෙනුව

**සංඛ්‍යා සටහන 3 - ගාස්තු**

**විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා අරමුදල් පැවරීමේදී ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම ගාස්තු**

| ගනුදෙනු පැවරීම් මාධ්‍යය | ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම ගාස්තු |
|---|---|
| ගනුදෙනුකරුගේ බැංකුවෙහි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු මගින් සහ ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු මගින් අරමුදල් පැවරීම. | රු. 50.00 |
| විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිටින සාමාජිකයෙකුගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතා කර අරමුදල් පැවරීම. | රු. 100.00 |
| බැංකු කවුළුව වෙත ගොස් අරමුදල් පැවරීම | රු. 100.00 |

රූප සටහන 4 අරමුදල් පැවරීම




සඳහා ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව රු. 50.00 ක් වේ.

තවද, මෙහි දී A නමැති බැංකුවේ X නමැති ගනුදෙනුකරු, B බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතා කර, B බැංකුවේ Y නමැති ගනුදෙනුකරුවකුට අරමුදල් පැවරීම සිදු කළහොත්, A බැංකුවේ ගනුදෙනුකරුගේ (X ගෙන්) අය කළ හැකි උරිපම ගාස්තුව රු. 100.00ක් වේ.

එසේම මෙම ගනුදෙනුවේදී ඉහත X ගනුදෙනුකරු තම බැංකුවේ එනම් A බැංකුවේ බැංකු කවුළුවට ගොස් ඒ හරහා B බැංකුවේ ගනුදෙනුකරුවකුට අරමුදල් පැවරීමක් සිදුකළ හොත් ගනුදෙනුකරු රු. 100.00 ක උපරිම ගාස්තුවකට යටත් වේ.

## ⋆ මෙහෙයුම් කටයුතු

මෙම යාන්ත්‍රණයේ සජීව මෙහෙයුම් කටයුතු 2015 අගෝස්තු 21 දින බලපත්‍රලාභී වාණිජ බැංකු 5 ක සහ බැංකු නොවන මුදල් සමාගම් 2 ක සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී. මේ වන විට දැනට සම්බන්ධ වී නොමැති එහෙත් ඉදිරියේ දී සම්බන්ධ වීමට බලාපොරොත්තු වන මූල්‍ය ආයතන එම කාර්යයේ විවිධ අදියර පසුකරමින් සිටී.

**සංඛ්‍යා සටහන 4:**
**විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්**

(2016 ජනවාරි අවසානයට)

| ප්‍රාථමික සාමාජිකයින් |
|---|
| 1. මහජන බැංකුව (2015 අගෝස්තු 21) |
| 2. ලංකා බැංකුව (2015 අගෝස්තු 21) |
| 3. හැටන් නැෂනල් බැංකුව (2015 අගෝස්තු 21) |
| 4. කොමර්ෂල් බැංකුව (2015 අගෝස්තු 21) |
| 5. කාගිල්ස් බැංකුව (2015 දෙසැම්බර් 01) |
| 6. HSBC බැංකුව (2016 ජනවාරි 21) |
| **ද්විත්ව සාමාජිකයින්:** |
| 1. LOLC ෆයිනෑන්ස් (2015 අගෝස්තු 21) |
| 2. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී. (2015 අගෝස්තු 21) |

(ඒ ඒ මූල්‍ය ආයතනය එම යාන්ත්‍රණයට සම්බන්ධ වූ දිනය වරහන් තුළ දක්වා ඇත.)

## විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) මගින් අත්වන වාසි

- අන්තර්ජාලය, ජංගම දුරකථන සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර වැනි විවිධ විද්‍යුත් මාධ්‍යයන් මගින් සිදුකරන බැංකු කටයුතු පොදු යටිතල පහසුකම් සහිත පසුබිමකට ගෙන ඒම තුළින් ඕනෑම විද්‍යුත් ගෙවීම් මාධ්‍යයක් භාවිතා කර ගනුදෙනුකරුට තම

ගිණුමෙන් අරමුදල් පැවරීමත් තම ගිණුමට වෙනත් අයෙකුගේ අරමුදල් ලැබීමත් තත්කාලීනව සිදු කළ හැකි වීම.

- ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම දේශීය ගනුදෙනු නිෂ්කාශනය සඳහා ජාල පහසුකම් සැපයීමත් සමග ජාත්‍යන්තර ජාල සමාගම් සඳහා ගෙවූ විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකි වීම.

- රට තුළ විද්‍යුත් ගෙවීම් කටයුතු වඩා කාර්යක්ෂමවීමත් විද්‍යුත් ගෙවීම් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් උපයෝජනය වැඩි කර ගැනීමටත් මේ තුළින් අවස්ථාව සැලසීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ගනුදෙනුකරුවකුට තම බැංකුවට නොගොස්, තමා කැමති ඉහත සඳහන් කළ ඕනෑම විද්‍යුත් ගෙවීම් මාධ්‍යයක් භාවිතා කරමින් වෙනත් බැංකුවක ගිණුම් හිමියෙකුට තත්කාලීනව අරමුදල් පැවරීමටත් එවැනි අයෙකුගෙන් අරමුදල් ලැබීමටත් පහසුකමක් හිමි වීම.

- විද්‍යුත් අරමුදල් හා ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා ශ්‍රී ලාංකික අනන්‍යතාවක් සහිත පද්ධතියක් ස්ථාපනය කිරීමට හැකි වීම.

- විවිධ විද්‍යුත් මාධ්‍යය මගින් සිදු කරන බැංකු කටයුතු සඳහා ශ්‍රී ලාංකික අනන්‍යතාවක් සහිත පොදු යටිතල පහසුකම් පද්ධතියක් ස්ථාපනය කිරීමට හැකි වීම.

මේ අනුව කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි අනෙකුත් උප යාන්ත්‍රණ ඉදිරි අනාගතයේ දී ස්ථාපිත කිරීමත් සමඟ මෙය ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් යාන්ත්‍රණය (National Payment Switch) ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ගෙවීම් ක්ෂේත්‍රයෙහි නව යුගයක් උදා කරනු ඇත.■


ශ්‍රී ලංකා මහ බැංකුවේ පණිවිඩයක්

දවසේ ඕනෑම වෙලාවක එසැණින් මුදල් හුවමාරු කිරීමට

ඔබත් CEFTS භාවිතා කරන්න


(විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණය)

CEFTS මගින් මුදල් යැවීම සඳහා

- අන්තර්ජාලය
- බැංකු ශාඛා (කවුන්ටරය)
- ජංගම දුරකථන
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

භාවිතා කළ හැක

මුදල් යැවීම සිදුවන්නේ කෙසේද?




යැවිය හැකි උපරිම මුදල් ප්‍රමාණය : රුපියල් මිලියන 5 කි.

අයකිරීම් : අන්තර්ජාලය හෝ ජංගම දුරකථන බැංකු හරහා (එක් ගණුදෙනුවක් සඳහා) රු. 50

: ATM යන්ත්‍ර හෝ බැංකු කවුන්ටර හරහා (එක් ගනුදෙනුවක් සඳහා) රු. 50 සිට රු. 100 දක්වා

2015 අගෝස්තු මාසයේ දී CEFTS ආරම්භ කරන ලදී.
මේ දක්වා රුපියල් බිලියන 51 ක් වටිනා ගනුදෙනු 610,000 ක ප්‍රමාණයක් සිදුකර ඇත.

වැඩි විස්තර සඳහා ඔබගේ වාණිජ බැංකුවෙන් විමසන්න

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

CEFTS ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය කෙරේ.

දුරකථන: 011 2398596 / ෆැක්ස්: 011 2387009 / විද්‍යුත් තැපැල්: psd@cbsl.lk

## විශේෂ සටහන - විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති

### හැඳින්වීම

පුනර්ජනනීය බලශක්තීන්වල[1] ඇති තිරසාරත්වය, ආර්ථික ප්‍රතිලාභ සහ විශේෂයෙන් ම එමගින් පරිසරය මත වන අඩු අයහපත් බලපෑම අවබෝධ කර ගනිමින් පසුගිය දශක කිහිපය පුරා සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල පුනර්ජනීනය බලශක්තීන් භාවිතා කිරීම වර්ධනය කිරීමේ ඉහළ නැඹුරුවක් දක්නට විය. මේ නිසා, ලෝකයේ මුළු විදුලිබල උත්පාදනයෙන් පුනර්ජනනීය බලශක්තීන්ගේ දායකත්වය 2005 වසරේ දී වාර්තා කළ සියයට 19.4 ට සාපේක්ෂව 2014 වසරේ දී 23.6 ක් දක්වා ඉහළ ගොස් ඇත.

### පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ ප්‍රතිලාභ

පුනර්ජනනීය බලශක්ති එහි අවේණික ස්වභාවය තුළින්ම තිරසාරකත්වය, අනාගත කාලගුණික ආරක්ෂිතභාවය, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම, නව රැකියා නිර්මාණය කිරීම සහ මානව සුභ සාධන වර්ධනය කිරීම ආදී විවිධාකාර ප්‍රතිලාභ ලබා දෙයි. මෙම පුනර්ජනනීය බලශක්ති මගින් ගෝලීය බලශක්ති සංකලනය කාබන්හරණය කිරීම තුළින් ගෝලීය කාබන් වර්ධනය අඩු කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පසුගිය දශක කිහිපය තුළ, ලොව පුරා ජීවන තත්ත්ව ඉහළ යෑම හේතුවෙන් විදුලිය උත්පාදනය සඳහා ඇති ගෝලීය ඉල්ලුම ජනගහන වර්ධනයට වඩා වැඩි වේගයකින් ඉහළ ගොස් ඇත. මෙම වැඩි වන ඉල්ලුමෙන් විශාල කොටසක් පරිසරයට හානිකර පොසිල ඉන්ධන දහනය හරහා සපුරා ගැනිණි. ඒ නිසා, හරිතාගාර වායු විමෝචන අඩු කිරීමට ලෝක මට්ටමේ උත්සාහයන් දිරිමත් කරමින් වායුගෝලීය හරිතාගාර වායු සාන්ද්‍රණය වැඩි වීම මගින් දේශගුණික විපර්යාස වීමට ඇති තර්ජනය පිළිබඳව වර්ධනය වන සම්මුතියක් පවතී. ගල්අඟුරු, තෙල් හා ස්වාභාවික වායු මගින් බලශක්ති උත්පාදනය තුළින් විමෝචනය වන සාමාන්‍ය කාබන්ඩයොක්සයිඩ් තීව්‍රතාව, පිළිවෙළින්, කිලෝවොට් පැයකට ග්‍රෑම් 960, 800 සහ 450 වන අතර පුනර්ජනනීය බලශක්තීන් මගින් කාබන්ඩයොක්සයිඩ් විමෝචනය නොකෙරේ[2]. ලොව පුරා ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධනය කාබන්හරණය තුළින් අත්කර ගැනීම සහතික කරමින්, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවල හත්වන ඉලක්කය තුළින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය අවධාරණය කරයි. පුනර්ජනනීය බලශක්තීන්ගේ දායකත්වය වැඩි කිරීම තුළින් කාබන්ඩයොක්සයිඩ් විමෝචනය සැලකිය යුතු ලෙස අවම කරන අතර, එමගින් ගෝලීය උෂ්ණත්වය ඉහළ නැගීම අවම කරමින් විනාශකාරී දේශගුණික විපර්යාස ඇතිවීම වළක්වනු ඇත.

තිරසාර සංවර්ධනය සහ බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳ සන්දර්භය තුළ පුනර්ජනනීය බලශක්තීන්වල භූමිකාව වඩාත් වැදගත් බවට පත් වී ඇත. 2030 වසර වන විට ගෝලීය බලශක්ති සංකලනයේ පුනර්ජනනීය බලශක්තිවල දායකත්වය දෙගුණ කර ගැනීම තුළින් ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය අවසන් උපයෝජනයන්හි ඉහළ අනුපාතයක් විදුලිය භාවිතයෙන් සිදුකර ගැනීම ද උපකාරී කර ගනිමින් සියයට 1.1 කින් වැඩි කරන බව අනතර්ජාතික පුනර්ජනනීය බලශක්ති ආයතනය (IRENA) පුරෝකථනය කරයි. රටෙහි බලශක්ති සුරක්ෂිතභාවය ද ඉහළ නංවන දේශීය මූලාශ්‍ර මත වැඩි වශයෙන් රඳා පවතින පුනර්ජනනීය බලශක්ති උත්පාදනය දිරිගැන්වීම තුළින් තෙල් ආනයනය කරන රටවල ආර්ථිකයන් මත යහපත් රැළිති බලපෑම් (ripple effects) ඇති කරමින් වෙළඳ ශේෂයන් වැඩි දියුණු කර ගැනීමට උපකාරී වන අතර දේශීය අගය එකතු කිරීම හා රැකියා අවස්ථා ද නිර්මාණය කරයි. පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය හරහා ෆොසිල ඉන්ධන තාක්ෂණයන්ට වඩා වැඩි රැකියා අවස්ථා නිර්මාණය කරන අතර එමගින් ඉහළ කුසලතාවලින් යුත් ශ්‍රම බලකාය සඳහා පමණක් නොව ප්‍රජාව පදනම් කරගත් ප්‍රවේශයන් හරහා අඩු ආදායම්ලාභී පවුල් සඳහා ද රැකියා අවස්ථා උදාකරයි. උදාහරණයක් ලෙස, ගල්අඟුරු හෝ ස්වාභාවික වායු බලශක්තීන්ට සාපේක්ෂව සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලශක්ති හරහා දෙගුණයකින් රැකියා අවස්ථා නිර්මාණය කරයි. එවැනි බොහෝ රැකියා නිර්මාණය වනුයේ දැව වැනි ඉන්ධන සැපයීම තුළින් සහ අගය එකතු කළ දේශීය තාක්ෂණයන් හරහා උපකරණ සවිකිරීම හා නිෂ්පාදනය කිරීම තුළිනි. තවද, පුනර්ජනනීය තාක්ෂණයන් හට අඩු සම්ප්‍රේෂණ හානි වීමක් ඇතිව විදුලිබල පද්ධතියට සම්බන්ධිත නොවූ විදුලිබල සේවාවන් ලබාදීමට ඇති හැකියාව හේතුවෙන් ඒවා ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට විදුලිබලය ලබාදීම සඳහා වඩාත් ගැළපෙන

1 පුනර්ජනනීය බලශක්ති යනු හිරු එළිය, සුළං, වැසි, වඩදිය බාදිය තරංග හා භූ තාපය වැනි මානව කාලපරිච්ඡේදයක් තුළ ස්වාභාවිකවම සකස්වන ලෙස සම්පත්වලින් උපදවන ශක්ති ආකාරයකි.


2 දහනයේ දී විමෝචනය වන කාබන්ඩයොක්සයිඩ් ශාක නැවත වැඩීමේ දී නැවත උරා ගන්න බැවින්, ශුද්ධ පදනමින් ගත් විට ජෛව ස්කන්ධ හරහා විදුලිබල උත්පාදනයේ දි කාබන්ඩයොක්සයිඩ් විමෝචනය ශූන්‍ය වේ.

අතර එමගින් ඵලදායි භාවිතයන් ප්‍රවර්ධනය, අධ්‍යාපනයට පෙළඹවීම, නවීන සන්නිවේදන තාක්ෂණයන්ට ප්‍රවේශය ඇති කිරීම හා නව ආර්ථික අවස්ථා රැසක් නිර්මාණය කිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනයට පහසුකම් සලසමින් දිළිඳුකම අවම කරයි.


## විදුලිබල උත්පාදනයේ සංයුතිය සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව තුළ විදුලිබල උත්පාදනය 1990 වසර අග දක්වා මූලික වශයෙන් ජල විදුලිය හරහා සිදුවිය. කෙසේ වුව ද, ආර්ථික වර්ධනය සහ වැඩි වන විදුලිබලය සඳහා වන

**රූප සටහන** **ස්ථාපිත ධාරිතාව**




**රූප සටහන** **විදුලිබල උත්පාදනය**




ප්‍රවේශයට අනුකූලව විදුලිබලය සඳහා වන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් 1980 දශකයේ මුල් භාගයේ සිට තාප විදුලි බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලදී[3]. 2015 අවසන් වන විට, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල විදුලිබල ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 1,377 වූ අතර ඉන්ධන තෙල්, ගල්අඟුරු සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාවයන් පිළිවෙළින් මෙගාවොට් 1,115, මෙගාවොට් 900 සහ මෙගාවොට් 458 ක් වූහ. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්, මෙගාවොට් 306.7 ක කුඩා ජල විදුලිබලයකින්, මෙගාවොට් 126.9 ක සුළං බලයකින්, මෙගාවොට් 13.1 ක ජෛව ස්කන්ධ බලයකින්, මෙගාවොට් 10.5 ක ඩෙන්ඩ්‍රෝ[4] බලයකින් සහ මෙගාවොට් 1.4 ක සූර්ය බලයකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව දැනටමත් එහි ප්‍රධාන ජල විදුලිබල විභවයන් සංවර්ධනය කර ඇති අතර, ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති හරහා මෙගාවොට් 186 ක වැඩි ධාරිතාවක් පමණක් පද්ධතියට එකතු කළ හැකි වනු ඇත. ඒ නිසා, වර්තමානයේ ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන් පිළිබඳ අවධානය යොමු කර ඇත. 2015 වසර වන විට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන් හරහා සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 10 ක් උත්පාදනය කිරීමේ ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙහි පළමු ඉලක්කය, එම මූලික ප්‍රතිපත්ති සකස් කළ 2006 වසරේ දී වාර්තා කළ සියයට 3.7 ට සාපේක්ෂව මේ වනවිට සාර්ථක ලෙස සියයට 11.2 ක දායකත්වයක් දක්වා එය ළඟා වී ඇත. පසුව, එම ඉලක්කය, 2020 වසර වන විට සියයට 20 ක දායකත්වයක් ළඟා කර ගැනීම සඳහා සංශෝධනය කරන ලදී. මෑතක දී රජය විසින් සකස් කළ දැනුම මත පදනම් ආර්ථිකය සඳහා ශ්‍රී ලංකා බලශක්ති අංශයේ සංවර්ධන සැලැස්ම: 2015-2025 මගින් පුනර්ජනනීය බලශක්තීන්ගේ පූර්ණ විභවය සහ අනෙකුත් දේශීය සම්පත් දියුණු කිරීම හරහා 2030 වසර වන විට බලශක්තීන්ගෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත් වීමට අපේක්ෂා කෙරේ. 2013 දී සියයට 3 ක් වූ පුනර්ජනනීය බලශක්තීන්ගේ ප්‍රාථමික ශක්ති සැපයුමේ දායකත්වය[5] 2030 වසර වන විට සියයට 34 ක් දක්වා වැඩි කිරීම, පුනර්ජනනීය බලශක්තීන්ගේ විදුලිය උත්පාදනය සඳහා වන දායකත්වය 2020 වසර වන විට සියයට 60 ක් දක්වා වැඩි කිරීම, ජෛව ස්කන්ධ විදුලිබල උත්පාදනය වැඩි කිරීම සහ 2025 වන විට බලශක්ති අංශයේ කාබන් විමෝචනය සියයට 5 කින් අඩු කිරීම වැනි ඉලක්ක කිහිපයක් මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය 2030 වසර වන විට කුඩා ජල විදුලි බලාගාර මගින් නිපදවන විදුලිය මෙගාවොට් 873, සුළං බලය මෙගාවොට් 401, සූර්ය බලශක්ති මෙගාවොට් 161 සහ ජෛව ස්කන්ධ බලය මෙගාවොට් 153 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

3 යාපනය අර්ධද්වීපයට විදුලිබලය සැපයීම සඳහා චුන්නාකම් තාප විදුලිබලාගාරය 1958 වසරේ දී ස්ථාපනය කළ ද 1973 වන තෙක් යාපනය අර්ධද්වීපය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ වී නොතිබුණි.


4 ඩෙන්ඩ්‍රෝ විදුලිබලය යනු තිරසාරව වවනු ලබන ජෛව ස්කන්ධ හරහා උත්පාදනය කරන විදුලිබලය වේ.

5 ජල විදුලිය හා ද්‍රව ඉන්ධන ලෙස භාවිතා කරන ජෛව ස්කන්ධ හැර

### සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනය සඳහා පවතින අවස්ථා

2015 වසර වන විට ශ්‍රී ලංකාව විසින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ පළමු වැදගත් සංධිස්ථානය ලෙස සමස්ථ විදුලිබල උත්පාදනයෙන් සියයට 10 ක් නිපදවීමේ ඉලක්කය අත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්ගේ මුළු ධාරිතාවයෙහි කුඩා ජලවිදුලි බලාගාරවල දායකත්වය සියයට 66.9 ක් වන හෙයින් ඒ හරහා විදුලිබල උත්පාදනය රටේ කාලගුණික තත්ත්වය මත රඳා පවතී. ඒ නිසා, විදුලිබල ඉල්ලුමේ අපේක්ෂිත ඉහළ වර්ධනය මගින් විශාල අභියෝගයක් ඇති වුව ද, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රටේ ස්වාභාවික උරුමයක් ලෙස පවතින සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් නෙලා ගැනීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව විසින් දැනටමත් සියලු ප්‍රධාන ජල සම්පත් උපයෝගී කරගෙන ඇති නමුත්, තවමත් ජල වාහක ව්‍යුහයන් විශේෂයෙන් කුඩා පරිමාණ ටර්බයින භාවිතයෙන් විදුලිබලය නිපදවීම වැඩි වශයෙන් භාවිතා නොකරන අතර වාරිමාර්ග ජාලයේ පවතින ජල විදුලිබලය නිපදවීමේ විභවය උකහා ගැනීමට ද බොහෝ දුරට උත්සාහ ගෙන නොමැත. තවද, විශේෂයෙන්ම, මන්නාරම, පුත්තලම සහ යාපනය යන ප්‍රදේශවල ගිගාවොට් 1 කට වඩා වැඩි සුළං බල විභවයක් ඇති බව හඳුනාගෙන ඇත. විදුලිබල කර්මාන්තය විසින් අති මහත් වූ ජෛව ස්කන්ධ සම්පත් බොහෝ දුරට ප්‍රයෝජනයට ගෙන නොමැති අතර කෘෂිකාර්මික අපද්‍රව්‍ය හා නාගරික ඝන අපද්‍රව්‍ය මගින් සැලකිය යුතු විදුලි බලශක්ති ප්‍රමාණයක් උත්පාදනය කිරීමට විභවයක් ඇත. නිවර්තන කලාපීය රටක් වීම සහ අනෙකුත් විකල්ප පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට සාපේක්ෂව පරිමාණය හා ප්‍රවේශය අතින් සූර්යබල ශක්තිය ඉහළ මට්ටමක පැවැතීම යන කරුණු සැලකීමේ දී සූර්ය බලශක්තිය රටට වඩාත් සුදුසු පුනර්ජනනීය බලශක්තියකි.

රූප සටහන — සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ස්ථාපිත ධාරිතාව




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

### සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනයේ දී මුහුණ පාන අභියෝග

ශ්‍රී ලංකාව විවිධාකාර පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අනූන වූවත්, තාක්ෂණික-ආර්ථික විවිධ ගැටළු පැවතීම හේතුවෙන් මෙම සම්පත් කාර්යක්ෂම භාවිතය අභියෝග යක් වේ. පොසිල ඉන්ධන හා අනෙකුත් සීමිත සම්පත් හා සසඳන විට පුනර්ජනනීය බලශක්තීන් අතිවිශාල ප්‍රදේශයක් පුරා විසිර ඇත. ඒ නිසා, එවැනි විසිරී පවතින සම්පත් ඒකාබද්ධ කිරීමට විදුලිබල පද්ධතියේ පවතින බාධක පුනර්ජනනීය බලශක්තීන් සංවර්ධනය සඳහා ඇඩි අවහිරතාවක් ලෙස පවතී. මෙමගින්, එම සම්පත් සාර්ථක ලෙස භාවිතා කිරීම සඳහා කාර්යක්ෂම ලෙස සම්පත් එකතු කිරීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාවය පිළිබඳ ගැටළු මතු කරයි. තවද, සම්ප්‍රේෂණ ජාලයෙහි පවතින සීමාවන් මගින් පද්ධතියට සම්බන්ධ කළ හැකි පුනර්ජනනීය බලශක්ති බලාගාර ප්‍රමාණය සීමා කරයි. බොහෝ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව කාර්මික නොවන ප්‍රදේශවල පිහිටා ඇති හෙයින් පුනර්ජනනීය බලශක්තීන් නිපදවන ස්ථානය හා සැපයුම් පද්ධතිය අතර දිගු සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම විශාල ගැටළුවකි. තවද, බලශක්ති ගබඩා කිරීමේ විසඳුම් මෙතෙක් වාණිජමය යථාර්ථයන් බවට පත් වී නොමැති බැවින් බොහෝ විට පුනර්ජනනීය බලශක්ති ගබඩා කළ නොහැකි බලශක්ති දාමවලට සීමා වී ඇත. මෙමගින් සැලසුම් නොකළ විදුලිබල අවශ්‍යතාවය සම්බන්ධ සීමා හා යම් අවස්ථාවක දී තනි මූලාශ්‍රයකින් ලබාගත හැකි බලශක්ති ප්‍රමාණය සම්බන්ධ සීමාවන් නිර්ණය කරන පද්ධති මෙහෙයුම් මාර්ගෝපදේශ ඉටු කරගැනීමේ ගැටළු මතු කරයි.

අධික වියදම් දරා විසඳුම් දීමට සිදුවන ඉහත සඳහන් තාක්ෂණික බාධකයන්ට අමතරව, අනිකුත් විදුලි ප්‍රභවවලට සාපේක්ෂව පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ බොහෝ වියදම් එහි ආරම්භයේ දී ම යෙදවීමට සිදුවන බැවින් පුනර්ජනනීය බලශක්තීන් ඉහළ මූලික වියදම්වලින් යුක්ත වන අතර එනිසා ඒවායේ මිල ගණන් වෙළෙඳපොළ බලශක්තීන්ට වඩා ඉහළ මිලක් ගනී. මෙමගින්, ප්‍රතිපත්ති සම්පාදකයින්හට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්ගේ වේගවත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගැටළු මතු කරයි. සුළං හා සූර්ය වැනි බොහෝ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් තවමත් ඔවුන්ගේ කාර්යක්ෂම පරිමාණ සඳහා සංවර්ධනය වෙමින් පවතී. පොසිල ඉන්ධන සමඟ තරගකාරී වන ජෛව ස්කන්ධ/ඩෙන්ඩ්රෝ බලය සලකා බැලීමේ දී, ඒ සඳහා පාරිසරික සීමාවන් මතු කරවන ඉහළ සිසිලන ජල අවශ්‍යතාවයක් පවතින අතර ඉන්ධන රැස් කිරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම ද ගැටලු සහගතය.

### ඉදිරි ක්‍රියාමාර්ග

පසුගිය වසර කිහිපය පුරා, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයෙහි වඩාත් ශක්තිමත් සහ කාර්යක්ෂම වර්ධනයක්

වී තිබේ. ශක්ති ගබඩා තාක්ෂණය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතී. 2008 වසරේ සිට ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය මිල සියයට 80 කින් පහත වැටී අතර, එය දිගටම පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සුළං විදුලිබලය ලාභදායීම නව විදුලි ප්‍රභවය බවට පත් කරමින්, එහි මිල ගණන් 2008 වසරේ සිට සියයට 30 කට ආසන්න ප්‍රමාණයකින් පහත වැටී ඇත. මෙම වර්ධනයන් විසින් ගෝලීය වශයෙන් පුනර්ජනනීය බලශක්තීන් වඩාත් ආකර්ෂණීය කර ඇත. මේ නිසා, ප්‍රතිපත්ති සම්පාදකයින්හට පුනර්ජනනීය බලශක්ති සඳහා හොඳම මූල්‍ය ක්‍රම සහ ඒවා සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ක්‍රමවේද සොයාගැනීමේ වැදගත් කාර්යභාරයක් පැවරී ඇත. මන්නාරම මහා පරිමාණ සුළං කලාපය සහ පුළුල් ව්‍යාප්ත දැව ඉන්ධන උපයෝගී කරගනිමින් සුදුසු ලෙස ස්ථානගත කළ මහා පරිමාණ ජෛව ස්කන්ධ/ඩෙන්ඩ්රෝ වැනි පුනර්ජනනීය බලශක්ති මහා පරිමාණ ලෙස සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. දැනටමත් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ආයෝජන පිළිබඳව ඉතා දිගු සාර්ථකත්වයක් ලබා ඇති බැවින්, මූල්‍ය ආයතන විසින් දීර්ඝකාලීන හා අඩු විදයම් මූල්‍යයන් ලබාදීමට උපකාර වනු ඇති අතර ජාතික බලශක්ති සංකලනයේ වඩා විශාල දායකත්වයක් සපුරා ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්තීන් පුළුල් කිරීමට දිගුකාලීනව කැපවීමක් තිබේ නම්, වැඩි වශයෙන් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට ද හැකි වනු ඇත. තවද, ජාත්‍යන්තර සහයෝගය හා මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීම ද මෙහි දී ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ඇති අතර ඒ අනුව වඩාත් විවාදයට තුඩු දී ඇති පුනර්ජනනීය බලශක්තීන් සංවර්ධනයේ දී ඉහළ මූලික වියදම දැරීමට සිදුවීම හා සම්බන්ධ ගැටළුවට පිළිතුරු සපයනු ඇත. පුනර්ජනනීය බලශක්ති සඳහා ඇති ඉල්ලුම තිරසාර හා පුළුල් වන විට තාක්ෂණය දියුණුවීමේ උපකාරය ද ලබමින් ක්‍රමයෙන් ආරම්භක පිරිවැය අඩු කර ගැනීමට පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට හැකි වනු ඇත. තරගකාරී පුනර්ජනනීය සම්පත් තෝරා ගැනීම පාරිසරික හා මානව සෞඛ්‍ය වැනි බාහිර සාධක ද ඇතුළත් දීර්ඝකාලීන ආර්ථික පිරිවැය විශ්ලේෂණය කිරීම් මත පදනම් විය යුතු අතර එහි මිල ප්‍රතිපත්තිය, පිරිවැය පිළිබිඹු කරන නිරන්තර සංශෝධන සඳහා විධිවිධාන, තරගකාරී ලංසු කිරීම හා අවස්ථා පදනම් කරගත් ඇගයීම් හරහා ආයෝජකයන් අතර තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම හා ඉහළ පිරිවැය ඉන්ධන තෙල් විදුලි උත්පාදනය ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය යනාදිය ද සමඟ තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

පුනර්ජනනීය බලශක්තීන්වල ඇති කඩින් කඩ විසිරුණු ස්වාභාවය මගින් මතුවන ගැටලුව විසඳීම සඳහා විදුලි පද්ධතියෙන් පරිබාහිරව ක්‍රියාත්මක කළ හැකි නව්‍ය ක්‍රමවේද හඳුනාගැනීම සහ පුළුල් ලෙස ව්‍යාප්ත විදුලි යටිතල පහසුකම්වල උපකාරයෙන් ක්ෂුද්‍ර ව්‍යාප්ති ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. විදුලිබල පද්ධතියේ හා සම්ප්‍රේෂණ ජාලයේ මතුවන බාධකවලට විසඳුම් ලබාදීම පැහැදිලිවම සංකීර්ණ හා කාලය වැය වන සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්වලින් සමන්විත වේ. කෙසේ වෙතත්, සියලු අදාල ආයතන හා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ සහාය ලැබෙන නොසැලෙන ප්‍රතිපත්ති කැපවීම් මගින් මෙම ගැටළුව ජය ගත හැකි වනු ඇත. ආයතන සහ අධිකාරීන්ගේ ක්‍රියාකලාපය ජාතික ප්‍රතිපත්තිය හා නොගැළපීම හේතුවෙන් වර්තමානයේ ගැටලුවලට මුහුණ පා ඇති පෞද්ගලික අංශය, මෙවැනි ප්‍රතිපත්ති ඒකාබද්ධතාවයක් හරහා ආයෝජනයට පෙළඹෙනු ඇති අතර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ක්‍රියා පටිපාටිය ද සුමට කරනු ඇත. එවැනි සියලු පිරිවර මගින් තාක්ෂණික-ආර්ථික බාධක ජය ගැනීමට පහසුකම් සලසනු ඇති අතර රටේ සියලු පාර්ශවකරුවන්ට පුනර්ජනනීය බලශක්ති විසින් ලබා දෙන විශාල පරාසයක ඇති මැදි හා දිගුකාලීන ප්‍රතිලාභ ළඟා කරගත හැකි වනු ඇත.


මූලාශ්‍ර :

IRENA Publications - http://www.irena.org/Publications/
- Renewable Energy Benefits: Measuring the Economics
- Rethinking Energy (2014,2015)

Ministry of Power and Renewable Energty, Sri Lanka- Sri Lanka Energy Sector Development Plan for a Knowledge-based Economy: 2015-2025

Worldwide electricity production - http://www.tsp-data-portal.org Breakdown-of-Electricity-generation-by-Energy-Source#tspQvChart

Sri Lanka Sustainable Renewable Energy Authority, Renewable Energy Resource Development Plan 1/2012

Ceylon Electricity Board, Grid Network, http://www.ceb.lk/sub/other/knowledge-center/#tab-1442494789429-6-6


උපුටා ගැනීම - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015

## විශේෂ සටහන - ස්ථායීතාව සහ ශක්තිමත්භාවය සඳහා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය

සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා සහ කම්පනයන්ට මුහුණ දීමට ආර්ථිකය සතු හැකියාව වර්ධනය කිරීමට සහයෝගය දැක්වීම අරමුණු කරගනිමින් රාජ්‍ය මූල්‍ය අවකාශ නිර්මාණය කිරීම පිළිබඳව විශේෂයෙන්ම, මූල්‍ය අර්බුදයෙන් පසුව ගෝලීය රාජ්‍ය මූල්‍ය බලධාරීන්ගේ අවධානය යොමු වී ඇත. අවිනිශ්චිත ගෝලීය ප්‍රවණතා, ඉහළ යන ණය සේවාකරණ වගකීම් සහ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය තුළින් ඇති වන පීඩනයන්, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතුවල තිරසාරභාවය කෙරෙහි අඛණ්ඩව අභියෝග ඇති කරන අතර, දියුණු සහ නැගීඑන වෙළඳපොළ ආර්ථිකවල පවතින සංරෝධිත රාජ්‍ය මූල්‍ය වාතාවරණය හමුවේ රාජ්‍ය අයවැය තුළ රාජ්‍ය මූල්‍ය අවකාශයක් සඳහා ඇති අවශ්‍යතාව වැඩිදියුණු කරයි. රජයේ අනාගත රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත අහිසි පීඩනයක් ඇති නොකොට, ශීඝ්‍ර සංවර්ධනයක් ලබා ගැනීමේ අවශ්‍යතාව, ශ්‍රී ලංකාව වැනි නැගීඑන මැදි ආදායම්ලාභී රටවල අයවැය ක්‍රියාවලිය සඳහා බලපෑම් ඇති කර තිබේ. මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි.

හෙලර් (2005) විසින් රාජ්‍ය මූල්‍ය අවකාශය යනු "රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තිරසාරභාවයට හෝ ආර්ථික ස්ථායීතාවට හානියක් නොවන පරිදි, රජයට තම සම්පත් අපේක්ෂිත අවශ්‍යතා සඳහා ලබාදීමට අයවැය තුළ පවතින ඉඩකඩ" වශයෙන් අර්ථ දක්වා ඇත[1]. එනම් රටෙහි සාර්ව ආර්ථික ස්ථායීතාවට හානි නොවන පරිදි වියදම්, ආදායම් හෝ ණය ලබාගැනීමේ විකල්ප පිළිබඳ තීරණ ගැනීමේ දී රජයට නම්‍යශීලී ලෙස තම අමතර සම්පත් උපයෝජනය සඳහා පවතින අවස්ථාව රාජ්‍ය මූල්‍ය අවකාශය වේ. රාජ්‍ය වියදම් සංයුතිය සහ ප්‍රවණතාව, බදු නැම්යාව, ණය ලබාගැනීමේ නැම්යාව මෙන්ම ආර්ථික වර්ධනය රාජ්‍ය මූල්‍ය අවකාශයේ ප්‍රධාන නිර්ණායකවලට ඇතුළත් වේ. එමනිසා ආදායම ඉහළ නැංවීම, වියදම් සීමා කිරීම හෝ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ණය ලබාගැනීම අවම කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීම මගින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ හැකි වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීමේදී, රාජ්‍ය මූල්‍ය වාතාවරණයේ තිරසාරභාවය කිසිසේත් කැපකළ යුතු නොවේ. එහිදී වියදම් වැඩසටහන් සඳහා සහ ණය සේවාකරණය සඳහා අවශ්‍ය කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍ය ශක්‍යතාව පවතින බවට රජය සහතික කළ යුතුය.

### ශ්‍රී ලංකා රාජ්‍ය අයවැයෙහි ව්‍යුහය

සීමිත සම්පත් සහිත පරිසරයක් තුළ වියදම් තරගකාරීව වර්ධනය වීම මෑත අතීතයේ ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාවලියෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් විය. ආදායම් ලැබීම් අඩුවීම සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය හමුවේ ඉහළ වියදම් අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස සෑම රජයක්ම නිරන්තරයෙන් සාපේක්ෂ වශයෙන් ඉහළ අයවැය හිඟයක් වාර්තා කරන ලදී. 2010 - 2015 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවෙහි අයවැය හිඟයෙහි සාමාන්‍යය ද.දේ.නි.යෙන් සියයට 6 ක් පමණ විය. රජයෙහි ආදායම් හා වියදම් ව්‍යුහය විමර්ශනය කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් මුහුණ දෙන අභියෝග හඳුනාගත හැක. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය වියදම්හි සාමාන්‍යය ද.දේ.නියෙන් සියයට 18.8 ක මට්ටමේ පවත්වා ගැනුණි. මෙම කාලසීමාව තුළ රජයේ වර්තන වියදම ද.දේ.නි.යෙන් සියයට 13.7 ක සීමාවෙහි පැවතුණ ද වර්තන වියදම් තුළ අයවැයෙහි නොවැළැක්විය හැකි වියදම් සංරචකයක් වන පොලී ගෙවීම් සහ වැටුප් හා දීමනා සඳහා වූ වියදම්, පුනරාවර්තන වියදමෙන් තුනෙන් දෙකකට වඩා දායකත්වයක් සපයමින් නොවෙනස්ව පැවතුණි. 2010 - 2015 කාලසීමාව තුළ දී වැටුප් හා වේතන සහ පොලී ගෙවීම්වල සාමාන්‍යය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 4.4 ක් සහ සියයට 4.7 ක් විය. තවද, මෙම කාලසීමාව තුළ දී අයවැයෙහි ඇතුළත් දිළිඳුකම අවම කිරීමෙහි ප්‍රධාන සංරචකයක් වන කුටුම්බ සඳහා ලබාදෙන සංක්‍රාම ද අයත්වන, සුබසාධන වියදම් සහ සංක්‍රාම ගෙවීම්හි සාමාන්‍යය ද ද.දේ.නි.යෙන් සියයට 3.0 ක් විය.


මෙම පසුබිම තුළ, අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීමට, පවත්නා අයවැය තුළ ඇති ඉඩකඩ සීමා සහිත වේ. රජය විසින් ප්‍රමුඛ අංශ වන අධ්‍යාපන සහ සෞඛ්‍ය වැනි අංශ සඳහා අවශ්‍ය වියදම් දැරීමේ දී රාජ්‍ය මූල්‍ය බලධාරීන් මෙම ගැටලුවට මුහුණපාන අයුරු පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. කාර්යයන් මත පදනම්ව වියදම් අධ්‍යයනය කිරීමේ දී සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි අංශ සඳහා අයවැයෙන් වෙන්කරන ලද අරමුදල්වල සාමාන්‍යය, සමස්ත අයවැයෙහි වියදම්න් සියයට 16 ක් පමණ වන අතර, 2015 වසරේ වර්ධනයක් පෙන්නුම් කළ ද 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපන සහ සෞඛ්‍ය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 1.7 ක් සහ සියයට 1.3 ක් විය. සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි අංශ සඳහා කරනු ලබන වියදම් ඉහළ දැමීම මගින් දිගු කාලීනව මානව ප්‍රාග්ධනය සඳහා ඉහළ ප්‍රතිලාභ අත්කර දෙන බවට තර්කයක් ගොඩනැගිය හැකිය. කෙසේ වෙතත්, අයවැයෙහි වියදම් යම් අන්දමකට රජයට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට අවම හැකියාවක් ඇති වත්මන් වියදම් ව්‍යුහය සැලකීමේ දී මෙම අරමුණු සඳහා වන අරමුදල් ඉහළ නැංවීම සඳහා රජය විසින් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය කිරීම අවශ්‍යව තිබේ.

ආදායම් පාර්ශ්වය සැලකීමේ දී රජයේ මුළු ආදායම් ලැබීම්, සමස්ත වියදමට වඩා සැලකිය යුතු ලෙස පහළ අගයක

1 Heller, P. (2005) 'Understanding Fiscal Space', Policy Discussion Paper PDP/05/4, Washington, DC : Fiscal Affairs Department, IMF

පවතින අතර, එය පුනරාවර්තන වියදම පියවා ගැනීමට ද ප්‍රමාණවත් නොවේ. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායමෙහි සාමාන්‍යය සියයට 12.4ක් විය. ප්‍රධාන වශයෙන්ම රටෙහි පවතින දුර්වල බදු රැස් කිරීමේ ක්‍රියාවලිය, ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු වී තිබේ. 2015 වසරේ දී එක් වරක් පමණක් ගෙවිය යුතු බදු කිහිපයක් පැනවීම ද හේතුවෙන් බදු ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.1 දක්වා ඉහළ ගිය ද 2014 වසරේ දී එය සියයට 10.1 දක්වා පහළ ගියේය. කලාපීය රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ බදු එකතු කිරීම අඛණ්ඩව දුර්වල මට්ටමක පවතී. විවිධ බදු නිදහස් කිරීම් හේතුවෙන් බදු පද්ධතියේ නම්‍යතාවය අඩු වීම, බදු පැහැරහැරීම් සහ දුර්වල බදු පරිපාලනය යන කරුණු ආදායම් එක්රැස් කිරීමෙහි දුර්වල කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**රූප සටහන** **ආදායම් සහ වියදම්වල ක්‍රියාකාරිත්වය**




ඉහළ වියදම් මට්ටම සමඟ පහළ මට්ටමක පවතින ආදායම් ජනනය වීමත් ඒ හේතුවෙන් දැනට ඇති ඉහළ අයවැය හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ රාජ්‍ය ණය මට්ටමක් නිර්මාණය වී තිබේ. 2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ණය සියයට 76 දක්වා ඉහළ ගොස් ඇත. මේ තුළින්, ණය සේවාකරණ ගෙවීම් ඉහළ නංවන අතර, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පීඩනයක් ඇති කර තිබේ. වර්තමානයේ දී, බදු සහ බදු නොවන ප්‍රභව හරහා උපයනු ලැබූ ආදායමෙන් සියයට 90 ක් පමණ ණය සේවාකරණ ගෙවීම් සඳහා යොදවනු ලැබේ. මේ අතර, උද්ධමනාත්මක නොවන දේශීය මූලාශ්‍ර ඔස්සේ ණය ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා සීමා වී ඇති අතර විදේශ මූලශ්‍ර මගින් ලබාගන්නා ණය මට්ටම ඉහළ ගියහොත් රට බාහිර කම්පනයන්ට භාජනය වීමට ඇති අවදානම ද ඉහළ යනු ඇත. රාජ්‍ය මූල්‍ය අවකාශයක් නොමැති වීම තුළින් ආර්ථිකයේ වර්ධනය වන සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා ණය ගැනීම ඉහළ දැමීමට රජයට නොහැකි වී ඇති බව පිළිබිඹු වේ.

**ඉදිරි දැක්ම**

රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සඳහා අවකාශය අවම වීම හේතුවෙන් සමාජයේ විවිධ අංශ වෙතින් සම්පත් සඳහා ඇතිවන නව ඉල්ලුම් තත්ත්ව රජයේ අයවැය තුළින් සපුරාලීම ඉතා අපහසු කාර්යයක් වේ. රජයට අමතර ණය ලබාගැනීමට ඇති හැකියාව අවම වීම හේතුවෙන්, බදු සහ වියදම් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම කළ යුතු වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම සඳහා පවතින අයවැය ව්‍යුහය විශාල ලෙස ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. අවම වශයෙන් ශ්‍රී ලංකාවේ කලාපීය රටවල් හා සමගාමීව ආදායම් ජනනය කිරීම වර්ධනය කිරීම හරහා ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්කගත කළ යුතු වේ. බදු පදනම ප්‍රසාරණය කිරීම සහ බදු අනුකූලතාව ඉහළ නැංවීම අරමුණු කරගෙන බදු ප්‍රතිංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. වියදම් පාර්ශ්වය සැලකීමේ දී, රජයේ වියදම් ප්‍රමුඛතා පිළිබඳ පුළුල් දර්ශනයක් සහිත මැදි කාලීන වියදම් රාමුවකට අනුරූපව, රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ යුතු වේ. එසේම, රටෙහි වියදම් සඳහා මූල්‍යමය වටිනාකමක් ලබාදීමට හැකි වන පරිදි වියදම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම කළ යුතුය. මෙම තත්ත්වය තුළ එක් එක් වියදම් අයිතම, ආර්ථික, දේශපාලනික, සමාජීය සහ රජයේ වෙනත් සැලකිය යුතු කරුණුවලට අනුරූපව ක්‍රමානුකූලව විමර්ශනය කළ යුතුය. තවද, විධිමත්ව සකසන ලද අයවැයට අමතරව පසුව ගනු ලබන වියදම් පිළිබඳ තීරණ හරහා රාජ්‍ය මූල්‍ය අවකාශය අවම වන හෙයින් එවැනි තීරණ ගැනීම සීමා කළ යුතුය. රජය සතු ව්‍යවසායන්වල මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමෙන් සහ එම ආයතන අයවැය මත රඳා පැවැත්ම අවම කිරීම හරහා රාජ්‍ය ව්‍යවසායවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමට රජය විසින් කටයුතු කළ යුතුය. ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. රජය විසින් කම්කරු සංවිධාන හා පොදු ජනතාව ඇතුළු සියලු පාර්ශ්ව සමඟ ක්‍රමවත් සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා ඇති විය හැකි විරෝධතා අවම කර ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

උපුටා ගැනීම - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.